ස්වාමීවූ යේසුස් ක්‍රස්තුස්වහන්සේ මෙලොව ජීවත්වූ කාලය තුල උන්වහන්සේගෙන් දිස්වූ මහිමය පිළිබඳ යොහාන් තුමා යොහාන් 1:14 හි පවසනුයේ ඒ මයිමය "කරුණාවෙන්ද සත්‍යයෙන් ද පූර්ණව තිබූ බවයි". ඒ උන්වහන්සේගේ චරිතය තුල දිස්වූ මහිමයයි. උන්වහන්සේ මරණය පරදා යළි නැගිට දෙවියන්වහන්සේගේ දකුනු පාර්ශවයේ වැඩ හිඳ ගැනීමෙන් අනතුරුව, යලිත් උන්වහන්සේගේ මහිමය පත්මොස් දූපතේදී සියැසින් දුටු යොහාන් තුමා, ඒ මහිමයේ විවිධ පැතිකඩ එළිදරව් 1:12-18 හි සඳහන් කර ඇත.

මෙම කුඩා පොතෙහි විවරණ කෙරෙන එම මහිමය අපගේ චරිතය, සුචරිතයක් බවට පත් කර එමගින් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය පෙරළා මහිමවත් කරනු ඇත.



ISBN 978-955-51101-5-0



# ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ

# නැවත නැගිටීමේ මහිමය

නෙවිල් ජයසුන්දර

# ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමය

1 වන මුද්‍රණය - 2013 මාර්තු

පිටපත් - 1000

ISBN 978-955-51101-5-0

නෙවිල් ජයසුන්දර

විස්ඩම් පබ්ලිෂර්ස් විසින් මුද්‍රණය කරන ලදී.
අංක 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත
දුරකථනය : 0773367777

# හැඳින්වීම

**"එළිදරව් පොතෙන් හෙළිදරව් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සත්වැදෑරුම් මහිමය"** නමින් මීට පෙර ප්‍රකාශයට පත්කැරුණු කුඩා පොතට පසු ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමය නමින් මේ පොත සම්පාදනය කැරිණි. මෙහි සාකච්ඡාවට භාජනය වනුයේ එළිදරව් 1 වන පරිච්ඡේදය තුලින් හෙළිදරව් වන යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීමේ මහිමයයි. පත්මොස් දූපතෙහි තනිව සිටි වයෝවෘධ යොහන් ප්‍රේරිත තුමාට ස්වාමීන්වහන්සේගේ දවස වන ඉරු දින ආත්මයාණන්වහන්සේ තුළ සිටියදී හොරණෑවක මෙන් මහත් ශබ්දයකින් තමාට පිටු පස සිට කථා කරන හඬක් ඇසිණි. ඉන් ඔබ්බට සිදු වූ දේ ශුද්ධ බයිබලයේ එළිදරව් පළමු පරිච්ජේදයේ මෙසේ සඳහන්ව තිබේ.

**"එකල මා සමග කථාකළ ශබ්දය කිමෙක්දැයි බලන්නට හැරුණෙමි. එසේ හැරුණු කල, රන් පහන් රුක් සතක්ද, ඒ පහන් රුක් මැද තමන්ගේ පාදය දක්වා වස්ත්‍රයක් පැළඳ රන් පටියකින් ළය බැඳගෙන සිටි මනුෂ්‍ය පුත්‍රයෙක් වැනිවූ කෙනෙක් ද දුටිමි. උන්වහන්සේගේ හිසද, හිසකේද සුදු ලොම් සහ හිම මෙන් සුදුය. උන්වහන්සේගේ ඇස් ගිනිදැල්ලක් හා සමානය. උන්වහන්සේගේ පාද උදුනක ගිනියම්කළ පිත්තල මෙන්ය, උන්වහන්සේගේ ශබ්දය බොහෝ ජල ඝෝෂාවක ශබ්දය මෙන්ය. උන්වහන්සේ ස්වකීය දකුණතෙහි තාරකා සතක් ඇතුව සිටිසේක. උන්වහන්සේගේ මුඛයෙන් දෙමුවහත් තියුණු කඩුවක් නික්මුණේය. උන්වහන්සේගේ මුහුණ තදින් බබළන සූර්යයා මෙන්ය. මම උන්වහන්සේ දුටු විට මළ කෙනෙකු මෙන් උන්වහන්සේගේ පාමුල වැටුණෙමි. එවිට උන්වහන්සේ තමන් දකුණත මා පිට තබා කියනසේක්**:

**“භය නොවන්න, මම පළමුවෙනියා සහ අන්තිමයාය, ජීවමානවූ තැනැත්තාය, මම මැරුණෙමි, නමුත් බලව, මම දැන් සදාකාලේටම ජීවත්ව සිටිමි, මරණයේද පාතාලයේද යතුර මට ඇත්තේය” (එළිදරව් 1:12-18).**

ඉහත දේව වචන කොටස තුළින් විස්තර වන්නේ පත්මොස් දූපතේදී යොහන් තුමාට හෙළිදරව් වූ යේසුස්වහන්සේගේ මහිමයයි. එවන් ආකාරයකට ඊට පෙර කිසි දිනෙක යොහන් තුමා යේසුස්වහන්සේව දැක තිබුනේ නැත. ඔහු මෙසේ දුටුවේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ තේජෝ මහිමය යයි පැවසිය හැක. එය දුටු යොහන් තුමාගේ ප්‍රතිචාරය කුමක්වීද? **“මම උන්වහන්සේ දුටු විට මළ කෙනෙකු මෙන් උන්වහන්සේගේ පාමුල වැටුණෙමි” (එළිදරව් 1:17).** යොහන් තුමාව ශුභාරංචි පොත් මගින් අපට හඳුන්වා දෙන්නේ යේසුස්වහන්සේ ප්‍රේමකළ ගෝලයා ලෙසයි. අවසාන රාත්‍රී භෝජනය අවස්ථාවේදී ඔහු යේසුස්වහන්සේගේ ළයට හාන්සි වී සිටි බව යොහන් 13:23 හි සඳහන් වේ. එහෙත් යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ මහිමය දුටු යොහන් තුමා උන්වහන්සේගේ පාමුල මළ කෙනෙකු මෙන් ඇද වැටුණේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ මහිමය වචනවලින් විස්තර කල නොහැක. එහෙත් යොහන් තුමා ඒ පිළිබඳව ලියා ඇති විස්තරය කියවා එම තේජෝ මහිමය පිළිබඳව යම් ප්‍රමාණයේ හෝ අවබෝධයක් ඇති කර ගැනීම ඇදහිලිවන්ත සැමට අත්‍යාවශ්‍යයි. මන්ද අපගේ ආත්මය තෘප්තියට පත්විය හැක්කේ යේසුස්වහන්සේගේ මහිමය දැකීමෙන් පමණකි. උතුම් දීමනා ලැබීම, යාච්ඤාවට පිළිතුරු ලැබීම හෝ සිතූ පැතූ දේ ඉටුවීම මගින් අපගේ සිත සතුටු වන නමුත් අප ආත්මය ඉන් තෘප්තිමත් නොවේ. අතෘප්තිකර ආත්මයක් සහිත කිතුණු ඇදහිලිවතුන් වර්ථමානයේ සුලබය. ඊට හේතුව ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ මහිමය පිළිබඳව

අවබෝධයක් නොමැති වීමයි.

පළමු ශතවර්ෂයේ ඇදහිලිවන්තයෝ බොහෝ පීඩාවන්ට මුහුණ දුන්නෝය. ප්‍රධාන කොට යුදෙව් ජාතික කිතුණු ඇදහිලිවතුන් මුහුණ දුන් පීඩනය විශාලය. අදහා නොගත් යුදෙව්වරු විසින් ඔවුන් පීඩාවට ලක් කරමින් ආපසු යුදෙව් ආගමට හැරී එන ලෙස බල කරන ලදී. දේවමාළිගාව, එහි මංගල උත්සව, සබත් දින, චාරිත්‍ර වාරිත්‍ර, ආකර්ශණීය පූජක වස්ත්‍ර සහ අනෙකුත් බාහිර ආටෝප සිත් ඇදගන්නා සුළු විය. යේසුස්වහන්සේ අදහාගත් යුදෙව්වරු ඒ දේවල් අත්හැර ආත්මික ජීවිතය පෙරදැරි කරගත් ඇදහිල්ලේ මාර්ගයක ගමන් කළහ. අලංකාර දේවමාළිගාව වෙනුවට ඔවුන්ගේ නිවෙස්වල රැස්වී රොටි-කඩමින් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් පසුවූහ. එහෙත් අවටින් පැමිණි පීඩනය නිසා කෙමෙන් ඔවුන් අධෛර්යයට පත්වන්නට වූහ. ආත්මික ආකාරවූ ඇදහිල්ලෙන් ඉවත් වී යලිත් පරණ ගිවිසුම් සංස්කෘතියට හැරියාමට මහත් පරීක්ෂාවක් ඔවුන් ඉදිරිපිට තිබිණි. එවන් අවදියක හෙබ්‍රෙව්වරුන්ට යවනු ලැබූ යැවුම් පත්‍රය ලියන ලදී. එම යැවුම් පත්‍රයෙහි පරිච්ඡේදයෙන් පරිච්ඡේදය ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය විදහා දක්වා තිබේ. හෙබ්‍රෙව් 2:9 හෙබ්‍රෙව් යැවුම් පත්‍රයෙහි තේමා පදය ලෙස සැලකිය හැකිය. **"යේසුස්වහන්සේ තේජස හා ගෞරවය නැමති ඔටුන්න පැළඳගෙන සිටින බව අපට පෙනේ"**. මෙම අද්වීතීය ප්‍රකාශනය එවකට සිටි යුදෙව් කිතුණු අදහිලිවන්තයන්ගේ ධෛර්යමත් වීම සඳහා දෙවියන්වහන්සේ විසින් භාවිතා කරන්නට ඇත.

පරණ ගිවිසුම් සංස්කෘතිය වෙත ආපසු හැරී යාමට ඔන්න මෙන්න කියා සිටි එම කිතුණු ඇදහිලිවත්හු යලිත් දිරිමත් වී තේජස සහ ගෞරවයෙන් පැළඳ සිටි යේසුස්වහන්සේ දෙසම බලා පීඩා විඳිමින් ඉදිරියට ගියහ. එදා සිට අද දක්වා සිටි සියලු ඇදහිලිවතුන්

ආත්මික ඇසින් දැකගත යුතු දර්ශණයද එයම වේ. වර්ථමාන කිතුණු ඇදහිලිවන්තයාගේ තදබල අවශ්‍යයතාවයත් මෙයයි. එය හුදෙක් වඩා හොඳ සභාවක් නොවේ; වඩා හොඳ දේශනාකරුවන්ද නොවේ; ශුභාරංචි සේවය සඳහා යොදා ගැනෙන නවීන තාක්ෂණයද නොවේ. කිතුණු ඇදහිලිවන්තයන් වන අපට මේ මොහොතේ අවැසි වන්නේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව පූර්ණ හෙළිදරව්වකි. උන්වහන්සේ තේජස සහ ගෞරවය නැමති ඔටුන්න පැළඳගෙන සිටින බව අප සියල්ලන් විසින් දැකගත හොත් වාර්ථමාන කිතුණු සභාව අත්දකින ආත්මික ඇල් මැරුණු ස්වභාවය පහව යනු නියතය. අපගේ බිය සහ සැක එවිට දුරුවී යනු නියතය.

එදා පත්මොස් දිවයිනෙහි තනි වී සිටි වයෝවෘධ යොහන් තුමාගේ සිතේ තිබුණු කනස්සල්ල, බිය සහ අවිනිශ්චිතභාවය එම දර්ශණය නිසා එක මොහොතින් පහව යන්නට ඇත. ලෝකෙට ලොක්කා යේසුස්වහන්සේ බව සැබෑ ලෙස දැන ගැනීම තරම් තවත් යහපතක් ඇදහිලිවන්තයෙකුට නැත. ස්වාමීවූ යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ ස්වභාවය තුළ තමා දුටු දේවල් විස්තර කරන්නට යොහන් තුමා උත්සාහ කෙලේය. තමා ඉදිරිපිට ජීවමානව සිටි මහිමවත් තැනැන්වහන්සේ ඇඳ සිටි වස්ත්‍ර පිළිබඳවද උන්වහන්සේගේ හිස, ඇස්, පාද, සහ මුව පිළිබඳවද තමා දුටු හැටියටම විස්තරයක් එළිදරව් පළමු පරිච්ජේදයේ සඳහන් කර තිබේ. එම විස්තරය යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමයේ පැතිකඩ හතක් පිළිබඳව කරුණු හෙළිදරව් කරන්නේ යයි සිතිය හැක. ඔහු දුටු බවට සඳහන් එක් එක් කරුණ මෙනෙහි කර එය ඔස්සේ සිතා බැලීමෙන් යේසුස්වහන්සේගේ මහිමයේ විවිධ පැතිකඩ පිළිබඳව තේරුම් ගැනීමට අපට හැකි වේ.

## 1 වන පරිච්ඡේදය

# ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිකත්වය

යේසුස්වහන්සේගේ එළිදරව් වීමේදී යොහන් තුමා දුටු පළමු දේ නම් උන්වහන්සේ "**තමන්ගේ පාදය දක්වා වස්ත්‍රයක් පැළඳ**" සිටි බවයි (1:13). උන්වහන්සේගේ දිගු වස්ත්‍රය පිළිබඳව යොහන්තුමා සඳහන් කරන්නේ ඇයි? ඒ තුළ උන්වහන්සේගේ මහිමය පිළිබඳව පණිවිඩයක් සැඟවී තිබෙන නිසායි. ඒ දිනවල පාද දක්වා දිගු වස්ත්‍රය මගින් ස්වාමිකත්වය පිළිඹිබු කෙරිණී. වහල් මිනිසුන් හට දණහිසින් පහලට වස්ත්‍ර හැඳීම තහනම් කොට තිබුණී. තවද යේසුස්වහන්සේ කුරුසිපත් වීමට පෙර දින රාත්‍රියේ උන්වහන්සේ තමාගේ උඩු කබාය ගලවා තබා තුවායක් ඉනේ දවටාගෙන සේවකයෙකු මෙන් පහත් වී ගෝලයන්ගේ පාද සේදූ විස්තරය යොහන් 13:4 හි සඳහන් කර තිබේ. ඒ නිසා මෙම දර්ශණයෙහි පාදය දක්වාවූ වස්ත්‍රයෙන් උන්වහන්සේ හඟවා දෙන්නේ තමන් තව දුරටත් සේවකයෙකු නොව ස්වාමියා බවයි. යේසුස්වහන්සේ නිර්වස්ත්‍රව කුරුසිය මත එල්ලී සිටීමේ දර්ශණය යොහන් තුමාගේ සිතේ තදින් සනිටුහන් වී තිබෙන්නට ඇත.

එහෙත් දැන් ඔහු ඉදිරිපිට තිබුනේ ඊට හාත්පසින්ම වෙනස් වූ දර්ශණයකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමිවරුන්ගේ ස්වාමින්වහන්සේ බව කිතුණු ඇදහිලිවන්ත වූ අප සියල්ලන් විසින් ඒත්තු ගත යුතුයි. අපගේ ජීවිතවලට යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය බලපාන ආකාර 3ක් පිළිබඳව සිහිකර ගැනීම ප්‍රයෝජනවත්ය.

## පුද්ගලික ජීවිතයේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිකත්වය

එක්තරා ඉරිදා පාසලක ගුරුවරයෙක් ළමුන්ගෙන් මෙහෙම ප්‍රශ්ණයක් ඇසුවා. "සෑම මිනිසෙකුගේ සිතේ භාණ්ඩ දෙකක් තිබෙනවා. එකක් කුරුසිය, අනික සිංහාසනය. ඒවගේම සෑම සිතකම පුද්ගලයන් දෙදෙනෙකුත් සිටිනවා. එක්කෙනෙක් යේසුස්වහන්සේ, අනෙක් තැනැත්තා තමාමයි. ප්‍රශ්ණය නම් මේකයි, මේ දෙදෙනා සිටින තැන් දෙක මොනවාද" ? එවිට පංතියේ සිටි ළමයි පිළිතුරු දන්නා බවට අත් එසවූහ. එසේ අත එසවූ අය අතුරින් එක් ළමයෙකුගෙන් විමසූ විට මෙසේ පිළිතුරුක් ලැබුණා. "යේසුස්වහන්සේ නම් ඉන්නේ කුරුසිය පිට"! "එසේ නම් ඔබ ඉන්නේ සිංහාසනය මතද." යි ගුරුවරයා ඇසුවා. එවිට සියලු දෙනා පිළිතුරු දී ගත නොහැකිව බලා සිටියා.

යේසුස්වහන්සේ කුරුසියේ සිටින දර්ශනය අප සෑම දෙනාට ඉතා හොඳට හුරු පුරුදු එකක් වෙලා. ඒ නිසා අප සෑම විටම බලන්නේ යේසුස්වහන්සේව කුරුසියේ තබන්නයි.

එහෙත් ඇත්තෙන්ම යේසුස්වහන්සේ දැන් කුරුසියේ නැහැ. උන්වහන්සේ දැන් ඉන්නේ සිහසුනේ. අපගේ හදවතේ සිහසුන යේසුස්වහන්සේට භාර දීම තමයි පුද්ගලික ජීවිතයේ යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය කියා කියන්නේ. අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ පුද්ගලික ගැලවුම්කරුවාණන් ලෙස පිළිගැනීම පමණක් ප්‍රමාණවත් නොවන අතර උන්වහන්සේගේ පාලනය අපගේ ජීවිතය කෙරෙහි ස්ථාපිත කර ගැනීම අති වැදගත් වේ. අද බොහෝ දෙනා යේසුස්වහන්සේ අදහන්නේ තම සිතැඟියාවන් ඉටු කර ගැනීම උදෙසායි. තමාගේ

උවමනා සපයා ගැනීම සඳහා යේසුස්වහන්සේට යාච්ඤා කරමින් වඩ වඩා ආත්මාර්ථකාමී වෙනවා මිස යේසුස්වහන්සේගේ ස්වාමීකත්වයට එනම්, පාලනයට යටත් වීමේ උවමනාවක් වැඩි දෙනෙකුට නැතුවා සේය. "ස්වාමීනී මට ආශිර්වාද කල මැනව, මං උදෙසා මේ දෙය කල මැනව, අර දෙය කල මැනවයි නොසැලකිල්ලෙන් කියන්නාවූ අප උන්වහන්සේට සලකන්නේ සේවකයෙකු ලෙස නොවේද? යමකු තමාගේ මිළ මුදල් වියදම් කිරීමේදී තම සේවකයාගෙන් අවසර නොගන්නා ලෙසම අපද යේසුස්වහන්සේගෙන් අවසර නොගෙන අප කැමති ආකාරයට මිළ මුදල් වැය කරන්නෙමු. ගමන් බිමන් යෑම සඳහා අවසරය තම සේවකයාගෙන් නොපතන්නාක් මෙන් අපිද උන්වහන්සේගේ අවසරයක් හෝ පාලනයක් නොමැතිව කැමති කැමති තැන්වල යන්නෙමු.

මේ තත්වය මෙසේ තිබියදීත් යේසුස්වහන්සේට ස්වාමීන්වහන්සේ යයි ආමන්ත්‍රණය කරන්නේ ඇයි? එසේ ආමන්ත්‍රණය කල ඇතැමෙකුට යේසුස්වහන්සේ පැවසූ දේ ලූක් 6:46 හි සඳහන් කොට තිබේ. **"මම කියන දේ නොකර ස්වාමීනි, ස්වාමීනි, මට කියන්නේ මක්නිසාද?"** ස්වාමීනි යන වචනය ඇසෙන විට යේසුස්වහන්සේගේ සිත සතුටට පත්වේ යැයි නොසිතන්න. අපගෙන් උදව් ලබා ගැනීමට පැමිණෙන උදවිය ගරු සම්මාන ඇතිව අපට කථා කරමින් අප මුලා කරති. එහෙත් යේසුස්වහන්සේව එසේ මුලා කල නොහැකිය. අප උන්වහන්සේගේ ස්වාමීකත්වය පිළිගත යුතුය. උන්වහන්සේ නිකම්ම යේසුස්වහන්සේ නොව ස්වාමීන්වහන්සේ වන යේසුස්වහන්සේය. ඔබගේ ජීවිතයේ සෑම අස්සක් මුල්ලක් නෑර යේසුස්වහන්සේට යටත් කර තිබේද? එසේ නැතිව කුඩා කාමරයක යතුර තවම ඔබ අතේද? එසේ නම් එම යතුරත් යේසුස්වහන්සේට භාර දිය යුතුය. කුඩා පාපයකට හෝ ඉඩ ඔබගේ ජීවිතයේ තිබේ නම් එය අනතුරු දායකය. ඔබ කල යුත්තේ සෑම පාපයක් ගැනම පසුතැවිලිව

යේසුස්වහන්සේට පාපෝච්චාරණය කර උන්වහන්සේගෙන් සමාව ලබා ගැනීමයි. **"මුහුන් ටිකකින් මුළු පිටි පිඬ පිපෙන්නේ"** යැයි 1 කොරින්ති 5:6 හි සඳහන්වේ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිකත්වය හෙවත් පාලනය අපගේ පුද්ගලික ජීවිතයේ ස්ථාපිත කර ගැනීම අත්‍යවශ්‍ය දෙයකි.

## ඇදහිලිවන්ත පවුල කෙරෙහි ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිකත්වය

ඉහත සඳහන් විෂයෙහි ඇති වර්ථමාන අදාලත්වය සහ වැදගත්කම කිතුණු මනසින් ගිලිහී ගොස් තිබෙන්නා සේය. ඇදහිලිවන්ත පවුල්, අවුල් වියැවුල් වී තිබෙන්නේ මේ නිසාය. ඇදහිලිවන්ත පවුලක් කෙරෙහි පැවතිය යුතු ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිකත්වය පිළිබඳව දෙවියන්වහන්සේගේ වචනය පුන පුනා ප්‍රකාශ කරයි. ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර තිබිය යුතු වූ සම්බන්ධතාවය දේව වචනයානුකූල වීම අති වැදගත්ය. **"එක එක පුරුෂයාගේ හිස ක්‍රිස්තුස්වහන්සේ බවද ස්ත්‍රියගේ හිස පුරුෂයා බවද ක්‍රිස්තුස්වහන්සේගේ හිස දෙවියන්වහන්සේ බවද නුඹලා දැනගන්නවාට කැමැත්තෙමි"** යි 1 කොරින්ති 11:3 හි සඳහන් වන වචන වර්ථමාන ඇදහිලිවතුන් බහුතරයක් විසින් අමතක කොට තිබේ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමය පිළිබඳව අවබෝධයක් ඇත්තෝ තම පවුල කෙරෙහි යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය පිළිබඳව සැලකිලිමත් වෙති. එහි අදහස නම් පවුල් ජීවිතය පිළිබඳව දේව වචනයෙහි එළිදරව් වන ප්‍රතිපත්ති වලට කීකරුවීමයි.

## එක මාංශය

**"මනුෂ්‍යයෙක් තමාගේ පියාද මවුද අත හැර තමාගේ භාර්‍යාවට ඇලුම් වන්නේය, ඔවුන් දෙදෙනා එක මාංශය වන්නේය" (එපීස 5:31).** මිනිස් ඉතිහාසයේ පළමු වතාවට දෙවියන්වහන්සේ විසින්ම සිදුකරනු ලැබුවාවූ ආදම් සහ ඒවගේ විවාහයේදී ඉහත ප්‍රතිපත්තිය දෙවියන්වහන්සේ ප්‍රකාශ කලසේක. එහි ඍජු අර්ථය නම් ස්වාමි පුරුෂයා සහ භාර්යාව තවදුරටත් දෙදෙනෙකු නොව එක්කෙනෙකු බවට පත්වීමයි. "එක මාංශයක් වීම" යනු ශාරීරික හෝ ලිංගික සම්බන්ධතාවය පමණයි යැයි වරදවා තේරුම් නොගත යුතුය. එය තුන් ප්‍රකාර සම්බන්ධතාවයකි. එනම් ශාරීරික, ප්‍රාණික හා ආත්මික සම්බන්ධතාවයයි. සෑම මනුෂ්‍යයෙකුම ත්‍රිත්වයකි. ශරීරයක්, ප්‍රාණයක් සහ ආත්මයක් මිනිසෙකුට හිමිය. විවාහක යුවලක් ශාරීරික සම්බන්ධතා පවත්වන්නාක් මෙන්ම ආදරය සහ ස්නේහය වැනි දේ තුලින් ප්‍රාණිකව සම්බන්ධ වෙයි. කිතුණු ඇදහිලිවන්තයාට පමණක් ආවේනික වූ දෙවියන්වහන්සේ විසින් ඉටු කරන්නාවූ සම්බන්ධතාවය නම් ආත්මික සම්බන්ධතාවයයි. පුරුෂයාගේ ආත්මයත් ස්ත්‍රියගේ ආත්මයත් ගෙන එකට බැඳීම ඇදහිලිවන්ත සරණ මංගල්‍යයේදී දෙවියන්වහන්සේ කරන වැඩ කොටසයි. මේ නිසා ඇදහිලිවතුන් දෙදෙනෙකු විවාහ වූ විට ඔවුන් සැබවින්ම ඒකත්වයකට පත්වෙයි. එබැවින් **"දෙවියන්වහන්සේ එක් කල දෙය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා"** යි දේව වචනය පවසයි (මතෙව් 19:6). එහි අදහස එවැනි වෙන් කිරීමක් මනුෂ්‍යයාට කල හැකිය යන්න නොවේ. ඒ ප්‍රකාශනයේ අදහස දෙවියන්වහන්සේ මිනිසා ඉදිරිපිට තබන අභියෝගයකි. "දෙවියන්වහන්සේ එක් කල දෙය" මනුෂ්‍යයාට වෙන් කල නොහැකිය යනු එහි සරල අදහසයි. මිනිස් ආත්මයට

අත ගැසිය හැක්කේ දෙවියන්වහන්සේට පමණී. ඒ නිසා ඇදහිලිවන්ත පුරුෂයෙකු සහ ස්ත්‍රියෙකු විවාහ වූ විට එය වෙන් කල නොහැකි සම්බන්ධතාවයකි. නීතිය හමුවේ දික්කසාද වූ පලියට දෙවියන්වහන්සේ විසින් එක් කල දේ වෙන් නොවේ. එම නිසා ඇදහිලිවන්ත යුවලකට දික්කසාදය විකල්පයක් නොවේ. යේසුස්වහන්සේගේ ස්වාමීකත්වය යටතේ සිටීම යනු මෙවන් ප්‍රතිපත්ති දැන සිටීමයි.

## පුරුෂයාගේ ප්‍රේමය සහ භාර්යාවගේ යටහත්කම

**"පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේම කොට ඈ උදෙසා තමන්ම පාවා දුන්නාක්මෙන්ම නුඹලාත් නුඹලාගේ භාර්යාවන්ට ප්‍රේම කරපල්ලා" (එපීස 5:25).**

පුරුෂයෙකු තම භාර්යාවට ප්‍රේම කල යුතු අකාරය මෙම පදයේ පැහැදිලි කරයි. ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේම කොට ඈ උදෙසා ජීවිතය පූජාකල සේක. නොහොත් මරණයට පත්වූ සේක. එසේ නම් භාර්යාව වෙනුවෙන් ස්වාමිපුරුෂයා කල යුත්තේද එයම වේ. එහෙත් විවාහ ජීවිතයේදී පුරුෂයාගේ "මරණය" එක විට සිදු වන්නක් නොව ටිකින් ටික දවසින් දවස සිදුවිය යුතු එකකි. තම කැමැත්ත, තම අංශාවන්, තම කීර්තිය, තම සැපපහසුව සහ තම වින්දනය වැනි තමාගේම කාරණාවලට මැරී සිටිමින් තම භාර්යාවට ප්‍රේම කිරීම දෙවියන්වහන්සේ අනුමත කරන පිළිවෙතයි. එහෙත් ජන සමාජය අතරේ පවතින අදහස නම් ස්වාමිපුරුෂයා වෙනුවෙන් භාර්යාව මරණයට පත් විය යුතුය යනුයි. හැම දුකක්ම විඳීම භාර්යාවට භාර කර ස්වාමිපුරුෂයා සැප ලබන්නට මාන බලයි. ඇත්තෙන්ම ස්ත්‍රියට සැබෑ උත්තරීතර තත්වය ලබා දෙන්නේ දෙවියන්වහන්සේගේ වචනයෙහි සඳහන් ප්‍රතිපත්ති වලිනි.

භාර්යාව වෙනුවෙන් "මරණයට පත්වීමෙන්" පමණක් පුරුෂයාගේ සැබෑ ප්‍රේමය සනාථ වේ.

**"භාර්යාවෙනි ස්වාමීන්වහන්සේට මෙන් නුඹලාගේ පුරුෂයාට යටහත්ව සිටපල්ලා" (එපීස5:22).**

පුරුෂයා භාර්යාවට දිවි හිමියෙන් ප්‍රේම කරන අතර භාර්යාවගේ යුතුකම වනුයේ පුරුෂයාට යටහත්ව සිටීමයි. **"ක්‍රිස්තුස්වහන්සේ සභාවේ හිසව සිටින්නා සේම පුරුෂයාත් භාර්යාවගේ හිසව සිටියි" (එපීස 5:23.)** මේ දිව්‍යය ප්‍රතිපත්ති වලට වර්ථමාන ලෝකය තුල ඉඩක් නැත. ඒවා ඉවත ලා කැරලිකාර මාර්ගවල ගමන් කිරීමෙන් ලෝකයේ විවාහ සංස්ථාවට සිදුවී ඇති හදිය අමුතුවෙන් පැවසීමට අවශ්‍ය නොවේ. කිතුණු පවුලේ යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය පවත්වා ගැනීමට නම් ඉහත කී ආකාරයේ දේව වචන ප්‍රතිපත්ති අනුගමනය කල යුතුව තිබේ.

**"දරුවෙනි නුඹලාගේ දෙමව්පියන්ට ස්වාමීන්වහන්සේ තුළ කීකරු වෙයල්ලා"** කියාද **"පියවරුනි නුඹලාගේ දරුවන්ට කෝප නූපදවා ස්වාමීන්වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන් ඇතිදැඩි කරපල්ලා"** කියාද දේව වචනයේ සඳහන් වේ **(එපීස 6:1-4).** මළවුන්ගෙන් නැවත නැගිටි යේසුස්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වනුයේ උන්වහන්සේගේ ස්වාමිකත්වය අපගේ පුද්ගලික ජීවිතවලද පවුල් ජීවිතවලද පවත්වා ගැනීමයි.

## සභා ජීවිතයෙහි ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමීකත්වය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් රැස්වූ එක්තරා ඇදහිලිවන්ත සභාවක් ගැන මෙවැනි කථාවක් කිව හැකිය. ඔවුන්ගේ නමස්කාර මෙහෙය මහ ඉහළින් උත්සවාකාරයෙන් පැවතුණි. ඇදහිලිවන්තයෝ බොහෝ දෙනෙක්ද පැමිණ සිටියහ. බයිබල් දැනුමෙන්ද වත්පොහොසත් කමින්ද ඉහළ තලයක සිටි මෙම සභාව තම මෙහෙය අවසන් කරමින් සිටියය. එදින අසන්නට ලැබුනේද හරබර දේශනාවකි. සභා නායකයා අවසාන යාච්ඤාව කරන අතරේ යමෙකු වසා තිබූ දොරට තට්ටු කරන හඬ ඇසුණි. එවිට දොරටුව භාරව සිටි තැනැත්තා ගොස් දොර හැරියේය. ඔහු දුටුවේ පුදුම දර්ශ-ණයකි. යේසුස්වහන්සේ දොර ළඟ සිටගෙන සිටිසේක. මෙපමණ වේලාවක් ඔවුන් දේව මෙහෙය පවත්වා තිබුනේ යේසුස්වහන්සේ නැතිවය. උන්වහන්සේ පිටත සිට සභාවට ඇතුල්වෙන්නට උත්සහා දරමින් සිටි සේක. නමුත් ඇදහිලිවන්නයන්ගේ සිත්වල ක්‍රියාකල "ස්වයංපෝෂිත" හැඟීම නිසා උන්වහන්සේට ඔවුන් මධ්‍යයෙහි ඉඩක් තිබුනේ නැත.

ඉහත සඳහන් කථාව ඇත්තටම සිදු වූ එකක් නොවු නත් එයින් ඉස්මතුවන අදහස අපට සිහි ගන්වන බයිබල් පදයක් එළිදරව් 3:20 හි ඇත. **"මෙන්න මම දොර ලඟ සිට තට්ටු කරමි, යමෙක් මාගේ හඬ අසා දොර හැරියොත් මම ඔහු වෙතට ඇතුල්ව ඔහු සමග කෑම කන්නෙමි, ඔහුද මා සමග කන්නේය".** මෙම වචන යේසුස්වහන්සේ පැවසුවේ ලවොදික සභාවටය. හැම දෙයකින්ම පරිපූර්ණව සිටියක්මෙන් පෙනුණු මෙම සභාව ඇත්තටම දුක්ඛිතව, දිළිඳුව, නග්නව, සිටි බව උන්වහන්සේ ප්‍රකාශ කල සේක.

## අළුත් ක්‍රිස්තුස්කෙනෙක්

වර්ථමාන ඇදහිලිවන්ත සභාවේ ප්‍රධාන අඩුපාඩුව මෙයයි. මිළ මුදලින් සහ බයිබල් දැනුමෙන් පිරුණු කිතුණු සභාවේ ඇති ප්‍රධාන අඩුපාඩුව නම් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ නොමැති වීමයි. මිනිස් අදහස් සහ සැලසුම් වලින් වර්ථමාන කිතුණු සභාව පිරී තිබේ යයි කීම වැරදි නැත. යේසුස්වහන්සේට සභාව මැද හිමි ස්වාමිකත්වය සහ ගෞරවය ලබා දෙනු වෙනුවට උන්වහන්සේ අලවි කරන භාණ්ඩයක් බවට පත්ව ඇත. තවද යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේ නොව සිතුම් පැතුම් ඉටුකර දෙන ඉටු දෙවියෙක් ලෙසද, වේදිකාව මත විජ්ජා කරුවෙකු ලෙසද, ඕනෑ එකක් ඔට්ටුයි යන ආකල්පය ඇති උඩ පනින්නන් සමඟ උඩ පනින, බිම පෙරලෙන්නන් සමඟ බිම පෙරලෙන, හිනා වෙන්නන් සමඟ හිනා වෙන , හූ කියන්නන් සමඟ හූ කියන, ඔක්කෝම ඉවසන, ඔක්කෝම කරන අපූරු පුද්ගලයෙක් බවට ප්‍රකාශයට පත්ව තිබේ. වර්ථමානයේ වැඩි දෙනා අනුගමනය කරන්නේ **"මම මාගේ සභාව ගොඩනගන්නෙමි නිරයේ දොරටු එය පරාජය නොකරන්නේ යයි"** ද **"මම පළමුවෙනියා සහ අන්තිමයාය ජීවමානවූ තැනැත්තාය, මම මැරුණෙමි, නමුත් බලව සදාකාලයටම ජීවත්ව සිටිමි. මරණයේද පාතාලයේද යතුරු මට ඇත්තේය"** යයිද පැවසූ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නොවේ. මනසින් නිර්මාණය කරගත් වෙනත් කවුද්දෝ ක්‍රිස්තුස්වහන්සේ කෙනෙක් පසු පස්සේ කිතුණු ජනතාව ගමන් කරන්නා සේය. අනුගාමිකයන්ගේ ක්‍රියා කලාපය නිසා යේසුස්වහන්සේගේ නාමය මේ තරම් හැල්ලුවට ලක් වූ තවත් කාල පර්විජේදයක් ඇත්තේම නැත. යේසුස්වහන්සේට අත්පොලසන් දෙන, ටටා කියමින් අත වනන, හූරේ හූරේ කියමින් විසිල් ගහන "ඇදහිලිවන්ත" කණ්ඩායම් බොහෝසෙයින් බිහිවී ඇත.

ශ්‍රී ලංකාවේ කිතුණු ඇදහිලිවන්තයන්ගේ සංඛ්‍යාව සහ කිතුණු සභා සංඛ්‍යාව පසුගිය වසර 10 තුලදී වැඩි වුයේ යැයි ගණන් බලන නමුදු ස්වාමීවූ යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය පිළිබඳව අවබෝධය ඊට සාපේක්ෂව වැඩි වුයේ යැයි කීමට නොහැකිය.

සභාව මධ්‍යයෙහි යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය පිළිගැනීම යනු දේව වචනයෙහි සඳහන් යේසුස්වහන්සේව අනුගමනය කිරීමෙහි ලා වූ ප්‍රතිපත්ති පිළිගැනීමයි. දෙවියන්වහන්සේගේ වචනය සුළු කරන්නේ නම් එතැන යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය ස්ථාපිත වන්නේද නැත. ශුද්ධ බයිබලයෙහි එළිදරව් වන අලුත් ගිවිසුම් සභාව අර්ථවත් වන ප්‍රතිපත්ති පිළිගැනීමට අප කැමති විය යුතුය. අපට ඕනෑ ඕනෑ විදියට යේසුස්වහන්සේව අනුගමනය කිරීම හා උන්වහන්සේට සභාවක් ගොඩනැගීම නිෂ්ප්‍රයෝජන උත්සහායකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පුද්ගලික ලෙස ඇදහීමෙන් අලුත් ඉපදීමක් ලැබීම, යේසුස්වහන්සේගේ නාමයෙන් පමණක් එක් රැස්වීම, සියලු ඇදහිලිවතුන්ගේ පොදු පූජකත්වය පිළිගැනීම සහ සභා නායකත්වය එක දේවගැති කෙනෙකුට සීමා නොවීම වැනි අති වැදගත් ප්‍රතිපත්ති වර්ථමාන කිතුණු සභාව පසෙකලා තිබීම හේතුවෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිකත්වය පිළිනොගන්නා බව මනාවට පෙන්නුම් කර තිබේ. මෙම තත්වය නියත ලෙසම වෙනස් විය යුතුය. ජාති බේදය, භාෂා බේදය, කුල බේදය, සහ නිකාය බේදය වැනි දෑට යේසුස්වහන්සේගේ ස්වාමිකත්වය යටතේ ඉඩක් නැත. සම්ප්‍රදායේ වහල් බැම්මට හසුවී සිටින ආගමික වහලුන් පිරිසක් වීමට කිතුණුවෝ කැමැත්ත පලකර සිටින්නා සේය. මේ සියලු අහිතකර දුක්ඛිත වූ දේ වෙනස් වන්නට නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සෑම පලාත් සභාවකම ස්වාමීන්වහන්සේ ලෙස මහ ඉහළින් පිළිගත යුතුව ඇත.

## 2 වන පරිච්ඡේදය

# ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පූජකත්වය

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පාදය දක්වා දිගු වස්ත්‍රයක් පැළඳ සිටීමෙන් සිහි ගැන්වෙන උන්වහන්සේගේ නැවත නැගිටීමේ මහිමය පිළිබඳව තවත් එක් පැතිකඩක් නම් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පූජකත්වයයි.

පරණ ගිවිසුමේ බල පැවැත්වූ ව්‍යවස්ථා නීති රීතිවලට අනුකූලව උත්තම පූජකයෙක් මනුෂ්‍යයන් අතරෙන් ශුද්ධස්ථානයේ සේවය සඳහා පත්කරනු ලබයි. ඉශ්‍රායෙල් ජනතාවත් දෙවියන්වහන්සේත් අතර එකම මැදහත්කරුවාණන් වූයේ ඔහුයි. එම උත්තම පූජකයාට අපූරු ඇඳුම් කට්ටලයක් නියමව තිබූ බව නික්මයාම 28 හි විස්තර කර තිබේ.

එම උත්තම පූජකයා, ඔහුගේ අපූරු ඇඳුම් කට්ටලය සහ උත්තම පූජක සේවය මගින් අපට සිහිගැන්වෙන්නේ අපගේ ප්‍රධාන උත්තම පූජකයාණන් වූ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳවයි. උතත්ම පූජක ඇඳුම් කට්ටලයේ කොටස් හතකි. ඒ ළය වැස්ම, ඒඵොද් සැට්ටය, ඒඵොද් සැට්ටයේ සළුව, විසිතුරු උතුරු සළුව, මකු-ටය, ඉඟ පටිය සහ හණ රෙදි කලිසම යනාදී වශයෙනි (නික්මයාම 28:4,42). මේ අතුරින් ඒඵොද් සැට්ටයට අයති සළුව නිල් පැහැයෙන් වන අතර එය පාදය දක්වා දිගු වස්ත්‍රයකි (නික්මයාම 28:31-34). මෙම දිගු වස්ත්‍රය පහළ වාටියේ රන් මිණි ගෙඩි සහ දෙළුම් ගෙඩි වලින් සරසා තිබිණි. පත්මොස් දූපතෙහි යොහන්ට

එළිදරව් වූ යේසුස්වහන්සේගේ පාදය දක්වා දිගු වස්ත්‍රයක් ඇඳ සිටීමෙන් යොහන් තුමා හට එක වතාවේම දේව මාළිගයෙහි සේවය කරන උත්තම පූජකයා සිහිවූවාට සැකයක් නැත.

කිතුණු ඇදහිලිවන්තයෙකු ලෙස ජයග්‍රාහී ජීවිතයක් ගත කිරීමට නම් අපට ස්වර්ගීක උත්තම පූජකයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තම පූජක මෙහෙය අත්‍යවශ්‍ය වේ. **"එබැවින් සෙනඟගේ පව් උදෙසා ශාන්ති පූජාවක් ඔප්පුකිරීමට දෙවියන්වහන්සේ පිළිබඳ කාරණා ගැන දයාවන්ත වූ විශ්වාසවන්තවූ උත්තම පූජකයෙක් වන පිණිස සියලු දෙයින්ම තමන්ගේ සහෝදරයන්ට සමානවෙන්ට උන්වහන්සේට යුතුවූයේය" (හෙබ්‍රෙව් 2:17).**
**"මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂාකරනු ලැබූ උත්තම පූජකයෙක්ය" (හෙබ්‍රෙව් 4:15:).**

පරණ ගිවිසුම් උත්තම පූජකයාට බාර වූ වැදගත් වගකීම් දෙකක් තිබුණි.

1 සමඟි කිරීමේ දවසේදී අති ශුද්ධාස්ථානයට ඇතුල් වී ජනතාවගේ පාපය උදෙසා සමඟිකමක් කිරීම.

2 ජනතාව සඳහා වූ දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැනගෙන එය ජනතාවට ප්‍රකාශ කිරීම.

## සමගි කිරීමේ දවස

ඉහත සේවයන් දෙකෙන් පළමු වැන්න සියලු ඉශ්‍රායෙල් ජනතාවට නැතුවම බැරි එකක් විය. එමගින් උත්තම පූජකයා සියලු පාප සඳහා දෙවියන්වහන්සේගෙන් සමාව ලබා දීමේ සේවය ඉටු කලේය. එය කරන ලද්දේ සත්වැනි මස දසවැනිදය. එයට සමඟිකිරීමේ දවස යයි කියන්නට යෙදුනි. ලෙවී 23:27 බලන්න. මෙසේ පාපය ගැන වන්දි මිළය ගෙවා සමගි කමක් කරනු ලැබූ වත්වතාවන් පිළිබඳව ලෙවී කථාව 16 වන පරිච්ජේදයේ 1 සිට 28 වන පදය දක්වා විස්තරාත්මකව සඳහන් වේ. මෙම අපූරු පුද පූජාව සඳහා එළුවන් දෙදෙනෙකු භාවිතා කරන ආකාරය එහි සඳහන් වේ. එකෙකු පාප පූජාව පිණිසය, උගේ ලේ ශුද්ධස්ථානයේ තිරයෙන් ඇතුලට උත්තමපූජකයා විසින් ගෙනයනු ලැබේ. අනෙකා සියලු මිනිසුන්ගේ පව් දරාගෙන වනාන්තරයේ අතරමං කිරීම පිණිසය (ලෙවි කථාව 16:15). උත්තම පූජකයා සියලු මිනිසුන්ගේ සියලු පාප එළුවාගේ හිස පිට අත තබා පාපෝච්චාරණය කිරීමෙන් අනතුරුව සුදානම්ව සිටින මිනිසෙකුගේ අතේ වනාන්තරයට ගෙන යනු ලැබ එහි අතරමං කරනු ලබයි (ලෙවි කථාව 16:21).

මෙම එළුවන් පිළිබඳ වත්වතාවෙන් අදහස් වනුයේ පාපයට වන්දි ගෙවීමත් පාපය පහ කිරීමත් යන වැදගත් සංකල්ප දෙකයි. අප ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තම පූජක මෙහෙයෙහි වැදගත් පැති කඩ දෙක මෙයම වේ. එනම් පාපය උදෙසා වන්දි මිළය ගෙවීම සහ පාපය පහ කිරීම නම්වේ.

උත්තම පූජකයා මෙන් වසරක් පාසා නොව ස්වාමීවූ යේසුස්වහන්සේ එකම වරක් තම රුධිරය සමග අති ශුද්ධාස්ථානයට

ඇතුල් වී අපගේ පාප උදෙසා වන්දි ගෙවූ සේක. **"නමුත් ක්‍රිස්තුස්වහන්සේ මතු පැමිණෙන්නාවූ යහපත් දේවල උත්තම පූජකයෙක්ව පැමිණ වඩා උතුම් වූ වඩා සම්පූර්ණ වූ අතින් නොසෑදුවාවූ එනම්, මෙම භූමික මැවිල්ලට අයිති නොවන්නාවූ මණ්ඩපය මැදින් එළුවන්ගෙත් වස්සන්ගෙත් ලේ කරණකොටගෙන නොව තමන්ගේම ලේ කරණකොටගෙන අප උදෙසා සදාකල මිදීම ලබා ගෙන එකම වරක් ශුද්ධස්ථානයට ඇතුල් වූ සේක" (හෙබ්‍රෙව් 9:11-12).** මේ සේවය නිසාම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ උත්තම පූජකයා ලෙස හඳුන්වනු ලැබේ. දෙවියන්වහන්සේගේ ප්‍රසාදය ලබා ගැනීම පිණිස අපට තව දුරටත් භූමික පූජකයන් උවමනා කරන්නේ නැත.

දෙවනුව, ඇදහිලිවන්ත ජීවිතයේ දිනපතා අපට ප්‍රයෝජනවත් වන අපගේ පාප පහ කිරීමේ ව්‍යායමය සඳහා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තම පූජක මෙහෙයේ දෙවැනි සේවය අප සැමට අවශ්‍ය කෙරේ. **"යමෙක් පව් කලොත් ධර්මිෂ්ඨ වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන මැදහත් කාරයෙක් පියාණන්වහන්සේ වෙත අපට සිටින සේක" (1 යොහන් 2:1).** දිනපතා අප පහසුවෙන් හසුකරන පාප උදෙසා දෙවියන්වහන්සේ ඉදිරිපිට මැදහත්කම් කරමින් අපට සමාව ලබා දෙනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තම පූජක මෙහෙය මගිනි. ඇදහිලිවන්ත අපට අවශ්‍ය වනුයේ එදිනෙදා අප සිදු කරන පාප වෙනුවට සමාව පමණක් නොව එම පාප අපගේ ජීවිතයෙන් පහකර දැමීම වේ. මේ සඳහා ස්වාමීවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ උත්තම පූජක සේවය අපට විශේෂිත වේ. යේසුස්වහන්සෙගේ අරමුණ නම් අප පිරිසිදු මිනිසුන් ලෙස දෙවියන්වහ්නසේ ඉදිරිපිට ඔප්පු කිරීමය.

## දෙවියන්වහන්සේගේ කැමැත්ත

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමයෙහි දෙවැනි පැතිකඩ වන ක්‍රිස්තුස්වහන්සේගේ පූජකත්වය පිළිබඳව අධ්‍යනයේදී උත්තම පූජකයෙකුගේ දෙවැනි මෙහෙය වන දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැනගෙන ජනතාවට ප්‍රකාශ කිරීම යන කරුණ ගැනත් මඳක් සාකච්ජා කල යුතුව ඇත. අප වෙනුවෙන් දෙවියන්වහන්සේ ඉදිරිපිට පෙනී සිටින අපගේ උත්තම පූජකයා ලෙස දෙවියන්වහන්සේගේ කැමැත්ත අපට එළිදරව් කිරීමේ වගකීම යේසුස්වහන්සේට පැවරී තිබේ. දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැනගැනීම පිළිබඳව වර්ථමාන බොහෝ කිතුණුවන් අවධානය යොමු කරන්නේ නැත. එහෙත් එය කිතුණු ජීවිතයේ අති වැදගත් ප්‍රතිපත්තියකි. **"නුඹලා අනුවණයන් නොවී ස්වාමීන්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම් ගනිල්ලා"** යයි එපීස 5:17 හිද **"නුඹලා දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමෙන් පූර්ණ වන්න"** යයි කොලොස්සි 1:9 හිද සඳහන්ව තිබේ. අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ කැපී පෙනෙන විශේෂ ලකෂණයක් නම් පියාණන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමයි. **"මාගේ කැම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ඨ කිරීම"** යයි යොහන් 4:34 හි ද **"මාගේ දෙවියන්වහන්ස, ඔබගේ කැමැත්ත කරන්නට ප්‍රිය වෙමි"** යි ගිතාවලිය 40:8 හා **"මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවා"** යි මතෙව් 26:39 යෙහිද සඳහන්ව තිබේ. මෙසේ ආදර්ශයක් දුන් අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ අපගේ ජීවිතවල දෙවියන්වහන්සේගේ කැමැත්ත හෙළිදරව් කර දෙන උත්තම පූජකයාණන්වහන්සේය. එහෙත් ඒ සඳහා අපගේ කැමැත්තක් තිබිය යුතුය. දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමෙහි ලා වැදගත්වන සාධක හතරක් තිබේ.

1. දේව වචනය තුළින් ලැබෙන මග පෙන්වීම.
   ගීතාවලිය 119:105
2. සභා නායකයන්ගේ මග පෙන්වීම සහ එකඟත්වය.
   හෙබ්‍රෙව් 13:7
3. හදවතේ වර්ධනය වන සමාදානය.
   යෙසායා 26:3
4. දේව කැමැත්තට අනුකූලව සිදුවන දෑ සහ ඇති වතාවරණය.
   එපීස 5:15-17

යේසුස්වහන්සේගේ දිගු වස්ත්‍රයෙන් එළිදරව් වන උන්වහන්සේගේ පූජකත්වය අපගේ ආත්මික වර්ධනය සහ අභිවෘධිය සඳහාය. අපගේ උත්තම පූජකයාත් දෙවියන්වහන්සේ ඉදිරිපිට අපගේ එකම මැදහත්කරුවාත් උන්වහන්සේය.

### 3 වන පරිච්ඡේදය

# ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැරකම

පත්මොස් දූපතෙහි එළිදරව් වූ යේසුස්වහන්සේ ගැන යොහන් තුමා දුටු තුන්වැනි දෑ නම් **"ළය වටා රන් පටියකින් බැඳ"** සිටීමයි (එළිදරව් 1:13).

මෙවන් රන් පටියක් ළය බැඳ සිටීමට හේතුව අලංකාර වීම හෝ එය ස්වර්ගීක මෝස්තරය නිසා හෝ නොවන බව පැහැදිලිය. යේසුස්වහන්සේ රන් පටිය බැඳ සිටි ස්ථානය ගැන මදකට සිතන්න. සමාන්‍යයෙන් මිනිසුන් පටිය බඳින්නේ ඉඟටියෙහිය. එහෙත් උන්වහන්සේ එය ළය වටා බැඳ සිටි සේක. ඉඟටිය ශක්තියේ ආසනය නිසා යම් වැඩක නියුතු විට අපි ඉඟටිය තද කර බැඳගනිමු. එහෙත් ළය ප්‍රේමයේ සහ අනුකම්පාවේ ආසනයයි. එසේ නම් රන් පටියකින් ළය බැඳ සිටීමෙන් අදහස් වන්නේ කුමක්ද? එය තේරුම් ගැනීම සඳහා එළිදරව් 15:6 කියවා බලන්න. **"එවිට පීඩා සත ඇතුව සිටියාවූ දේවදූතයන් සත්දෙනා පවිත්‍රවූ දීප්තිමත්වූ වස්ත්‍ර පැළඳ රන්පටිවලින් තමුන්ගේ ළය බැඳගෙන දේවමාළිගාවෙන් පිටත්ව ආවෝය"**. එම දූතයන් දේවමාළිගාවෙන් පිටතට පැමිණියේ දෙවියන්වහන්සේගේ උදහසේ භාජන පොළොව මත වැගිරවීමටයි. එහි ප්‍රතිඵලය නම් අති භයානක විනිශ්චය පොළොව මතට හෙළනු ලැබ මිනිසුන් දුක්ඛිත ලෙස පීඩාවට පත්වීමයි. එවන් පීඩාවන් ලොව වැසි ජනතාවට ගෙන ඒමේදී දේවදූතයෝ රන්පටියකින් ළය බැඳ සිටිති. එහි අදහස නම් ප්‍රේමය සහ අනුකම්පාව වලක්වා ගැනීමයි. යේසුස්වහන්සේ ළය බැඳ සිටීමේ අදහසත් එයම වේ යැයි සිතිය හැක. යේසුස්වහන්සේ

අනුකම්පාවෙන් පූර්ණ ප්‍රේමවන්ත ගැලවුම්කරුවාණන් සේම සැර විනිශ්චයකරුවාණන්ද වන සේක. මේ පිළිබඳව රෝම 11:22 සඳහන් දේව වචනය සලකා බලන්න. **"එබැවින් දෙවියන්වහන්සේගේ යහපත්කමත් සැරකමත් බලපන්න. වැටුණවුන් කෙරෙහි සැරකමය. නමුත් නුඹ උන්වහන්සේගේ යහපත්කමෙහි පවතින්නෙහි නම් නුඹ කෙරෙහි දෙවියන්වහන්සේගේ යහපත්කමය".**
අප නිතර කතිකාවට භාජනය කරන්නේ දෙවියන්වහන්සේගේ යහපත්කමයි. එහෙත් දෙවියන්වහන්සේගේ සැරකම පිළිබඳව ශුද්ධවූ බයිබලයෙහි බොහෝ කරුණු අනාවරණය කර තිබේ.

සභා යුගය අවසානයේදී මෙලොවට පීඩා කාලයක් පැමිණෙන බව ඔබද අසා තිබෙනවා ඇත. අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වචනවලින්ම කියතොත් එය මෙසේය. **"ලෝකයේ පටන් ගැන්මේ සිට මේ දක්වා නූනාවූ මතු කොයිකලෙකත් නොවන්නාවූ මහත් පීඩාවක් ඒ කාලයේහි වන්නේය" (මතෙව් 24:21).** මෙම පීඩා කාලය පිළිබඳව එළිදරව් පොතේ 6 වන පරිච්ඡේදයේ සිට 19 පරිච්ඡේදය දක්වා විස්තර කර තිබේ. එම සිත් ඇලලී යන විස්තරය මගින් දෙවියන්වහන්සේගේ සැරකම පිළිබඳව යම් අවබෝධයක් අපට ලබා ගත හැකිය. එහෙත් ඒ උන්වහන්සේගේ සැරකමේ එක පැතිකඩක් පමණි. එළිදරව් 1:18 හි යේසුස්වහන්සේ තමා හඳුන්වා දෙන්නේ මරණයේද, පතාලයේද යතුරු ඇති තැනැත්තා හැටියටයි. ජීවන පොතෙහි නම ලියා නැති හැම දෙන පතාලයේ නොහොත් නිරයේ හෙලීමේ බලය යේසුස්වහන්සේට තිබේ. උන්වහන්සේ එය කරන බව එළිදරව් 20 වැනි පරිච්ඡේදයේ සුදු සිංහාසනය පිළිබඳව විස්තරයේ සඳහන්ව තිබේ. එතැනදී මිනිසුන් උස් පහත්, දුප්පත් පොහොසත් බේදයක් නොමැතිව ගිනි විලට නියම කරනු ලබන බව සඳහන් වේ. එළිදරව් 20:11-15 දක්වා කියවා තේරුම් ගන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ

සැරකම ඉන් මොනවට පැහැදිලි වෙනවා නොවේද? දෙවියන්වහන්සේ පිළිබඳව මෙම යථාර්තය දෙස බොහෝ දෙනා සිත යොමු කොට නැත. "යේසුස් යහපත්ය" යන සංගීතය අප නිරායාසයෙන් ගායනා කරන්නෙමු. එහෙත් උන්වහන්සේගේ සැරකම ගැන සිතා නොබලන්නේ මන්ද? පත්මොස් දූපතෙහි යොහන්ට එළිදරව් වූ විට තම ළය රන්පටියකින් බැඳ සිටීමෙන් යේසුස්වහන්සේ අපට සන්නිවේදනය කරන්නේ උන්වහන්සේගේ සැරකමයි. උන්වහන්සේව හැම දෙනා අගය කරන, පසසන චරිත ගුණාංගය වන ප්‍රේමය සහ අනුකම්පාව වලකාගෙන මිනිස් සංහතියට දෙවියන්වහන්සේගේ විනිශ්චය ගෙන ඒමේ කර්තව්‍යය උන්වහන්සේට භාර දී තිබේ. ඇතන්ස් නුවරදී දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව ශුභාරංචිය දේශනා කල පාවුල් තුමා එම දේශනය අවසන් කලේ මෙම සත්‍යතාවය අවධාරණය කරමිනි. **"මක්නිසාද තමන්වහන්සේ විසින් පත්කල මනුෂ්‍යයා ලවා ලෝකය ධර්මිෂ්ඨකමින් විනිශ්චකරන්ට එක් දවසක් නියම කර තිබේ" (ක්‍රියා 17:31).** දෙවියන්වහන්සේගේ විනිශ්චයට යටත්වන මිනිසුන් හට අනුකම්පා කිරීමට කිසිවෙකු නැත. එය ඉතා භයංකර සිතුවිල්ලකි.

ඉහත සැකවින් සඳහන් කල ආකාරයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැරකම ප්‍රකාශවන අදියර දෙකක් තිබේ. ඉන් පළමුවැන්න සභා යුගය අවසානයේදී ලොවට පැමිණෙන පීඩා කාලයයි. දෙවැන්න සියලු පව්කරුවන් නිරයට හෙලන සුදු සිංහාසන විනිශ්චයයි.

1 වන අදියර

## පීඩා කාලය

පීඩා කාලය, යේසුස්වහන්සේ විසින් ඇදහිලිවන්ත සභාව ස්වර්ගයට ඔසවා ගැනීමෙන් අනතුරුව මෙලොව සිදුවන්නක් බව තේරුම් ගැනීමට තරම් සාධක, තොරතුරු දෙවියන්වහන්සේගේ වචනයෙහි අඩංගුව තිබේ. මෙම කාලය තුල පොළොව පිටට පීඩා පැමිණෙන පියවර හතරක් පිළිබඳව එළිදරව් පොතේ සඳහන්ව තිබේ.

1. මුද්‍රා සත කඩනු ලැබීම - එළිදරව් 6 සහ 7
2. හොරණෑ සත පිඹිනු ලැබීම - එළිදරව් 8 සහ 9
3. ගර්ජනා සත ශබ්ධ පවත්වනු ලැබීම - එළිදරව් 10:4
4. උදහසේ භාජන සත පොළොව පිටට වගුරුවනු ලැබීම - එළිදරව් 15 සහ 16

මෙම විනිශ්චයේ පියවර හතර කියවා බැලුවහොත් මොනතරම් භයානක සහ දුක්ඛිත දේ මේ පොලව මත සිදුවන්නට තිබේ දැයි වටහා ගැනීම අපහසු නොවේ. භයානක භූමිකම්පා, සාගත, වසංගත, මුහුදු ජලය ලේ බවට හැරීම, විකිරණශීලී අකාශ වස්තු පොලව මතට කඩා වැටීම, ඉර සහ සඳ අඳුරු වීමෙන් සිදුවන හානිය, ජාතීන් අතර ඇවිලෙන යුධ ගිනි සහ මිනිසුන් මහත් සේ පීඩාවට ලක් කරන භූත ආත්ම පැමිණීම වැනි අනෙක් පීඩාවලින් ලෝ වැසි ජනතාව දුක්ඛිත භාවයට පැමිණේ. මුහුදේ වතුර ලේ වීම නිසාත් සියලු ජල උල්පත් විස වීම නිසාත් මොනතරම් විනැහියක් සිදුවනු ඇද්ද? මේ යේසුස්වහන්සේගේ සැරකමය.

යේසුස්වහන්සේගේ සැරකම මෙසේ ප්‍රකාශ වීමෙන් සිදුවන්නේ කුමක්ද? ඇත්තෙන්ම එයින් සිදුවන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය ප්‍රකාශ වීමයි. **"ස්වාමීන්වහන්සේ මාගේ ස්වාමීන්ට කථාකොට, මා විසින් නුඹේ සතුරන් නුඹේ පාපුටුව කරන තෙක් මාගේ දකුණු පැත්තෙහි හිඳින්නැයි කී සේක" (ගීතාවලිය 110:1)** යන අනාගත වාක්‍යය පීඩා කාලය තුලදී ඉටු වනු ඇත. මිනිසා ස්වෙච්ඡාවෙන් දෙවියන්වහන්ගේ පුත්‍රයාණන් අභියස දණ නොනැමීමේ හේතුවෙන් බලවත් පීඩා කරණකොටගෙන දෙවියන්වහන්සේගේ එම අභිප්‍රාය ඉටු කරනු ලබයි. අවසානයේදී **"ස්වර්ගයේද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස්වහන්සේ යන නාමයෙන් දණ නමන පිණිස"** යයි පිලිප්පි 2:10 හි ලියැවී ඇති අනාගතවාක්‍ය ඉටු වේ.

පීඩාකාලයේ කටුක භාවය මොනවට පැහැදිලි කරන පහත සඳහන් දේව වචන කොටස් කියවා දැනුවත් වෙන්න.

**"පොළවේ රජවරුද උත්තමයෝද සේනාපතියෝද ධනවන්තයෝද බලවන්තයෝද සියලු දසයෝද නිර්දසයෝද කඳුවල ගුහාවලත් පර්වතවලත් සැඟවුණෝය. ඔව්හු කඳුවලටත් පර්වතවලටත් කථාකොට අප පිට වැටී, සිංහාසනයෙහි වැඩ සිටින තැනැත්වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත් බැටළු පැටවාණන්ගේ උදහසිනුත් අප සඟවාගන්න. මක්නිසාද උන්වහන්සේගේ උදහසේ මහත් දවස පැමුණුන බැවින් සිටින්ට පුළුවන් කාටදැයි කීවෝය" (එළිදරව් 6:15-17).**

**"උන්ට අවසර දුන්නේ මිනිසුන් මරන පිණිස නොව ඔවුන් පස් මසක් වධකරනු ලබන පිණිසය. ඔවුන්ගේ වේදනාව මනුෂ්‍යයෙකුට ගොණුස්සෙක් ඇන්න කල හටගන්න වේදනාව මෙන් වුයේය. ඒ දවස්වලදී මනුෂ්‍යයෝ මරණය සොයන්නෝය. නුමුත්**

**කිසිසේත් එය සම්බනොවන්නේය. මැරෙන්නට ආශාවන්නෝය, එහෙත් මරණය ඔවුන් කෙරෙන් පලයන්නේය" (එළිදරව් 9:5,6).**

**"එකල පළමු වැනියා ගොස් තමාගේ පාත්‍රය භූමියෙහි වැගිරෙවුවේය. එවිට මෘගයාගේ ලකුණ ඇත්තන්ද ඔහුගේ රූපයට නමස්කාරකරන්නන්ද කෙරෙහි වස අරිෂ්ට වණ හටගත්තේය" (එළිදරව් 16:2).**

**"තුන්වැනියා තමාගේ පාත්‍රය ගංගාවලද දිය උල්පත්වලද වැගිරෙවුවේය. එවිට ඒවා ලේ වුණේය" (එළිදරව් 16:4).**

**"සතරවෙනියා තමාගේ පාත්‍රය සූර්යයා පිට වැගිරෙවුවේය. එවිට ගින්නෙන් මනුෂ්‍යයන් දවන්ට ඊට බලය දෙනලද්දේය. මහත් උෂ්ණයකින් මනුෂ්‍යයෝ දවනු ලැබ, මේ පීඩා කෙරෙහි බලය ඇති දෙවියන්වහන්සේගේ නාමයට අපහාසකළෝය. උන්වහන්සේට ගෞරවය දෙන ලෙස ඔව්හු පශ්චාත්තාපනුණෝය" (එළිදරව් 16:8,9).**

**"අහසෙන් මහත් ගල් වර්ෂාවක්ද මනුෂ්‍යයන් පිටට වැස්සේය. එහි එක එක ගල තලෙන්තයක් පමණ බරය. මනුෂ්‍යයෝ ගල්වර්ෂාවේ පීඩාව නිසා දෙවියන්වහන්සේට අපහාසකළෝය. මක්නිසාද එහි පීඩාව ඉතා මහත්විය" (එළිදරව් 16:21).**

වර්ථමානයේ මිනිසා ඉදිරිපිට දෙවියන්වහන්සේ තබා ඇත්තේ යේසුස්වහන්සේගේ යහපත්කමත් උන්වහන්සේ කුරුසිය මත මරණයට පත්වීමත්ය.

සෑම මිනිසුන්ගේ පාප උදෙසා උන්වහන්සේ වන්දි මිළය ගෙවූසේක. එම නිසා යේසුස්වහන්සේ කෙරෙහි අදහන්නන් නොමිලයේ ධර්මිෂ්ඨ කොට ගණන් ගන්නට දෙවියන්වහන්සේ තීරණය කොට තිබේ. මෙවැනි පුදුමාකාර සැපයීමක් ප්‍රතික්ෂේප කරන්නේ නම් යේසුස්වහන්සේගේ සැරකම භුක්තිවිඳිමට ලෝ වැසි ජනතාවට සිදුවනු ඇත.

2 වන අදියර

## සදාකාල විනිශ්චය

මෙලොව පැවැත්මේ අවසානයේදී මෙලොව ජීවත් වූ සියලු මිනිසුන් විනිශ්චය කරනු ලබන පිණිස මහා ධවල සිංහාසනය දෙවියන්වහන්සේ විසින් නියම කොට තිබේ. මෙයින් දෙවියන්වහන්සේගේ විනිශ්චයේ සැරකම මනාවට පැහැදිලි වේ. **"තවද මහත් සුදු සිංහාසනයක්ද එහි වැඩහුන් තැනැන්වහන්සේද දුටිමි. උන්වහන්සේගේ අභිමුඛයෙන් අහසත් පොළවත් පලාගියේය: ඒවාට ස්ථානයක්ද සම්බ නූණේය. මළාවූ ලොකු කුඩා අයද සිංහාසනය ඉදිරියෙහි සිටිනවා දුටිමි. පොත්ද දිග හරිනු ලැබුවේය. ජීවන - පොත වන තවත් පොතක්ද දිග හරිනු ලැබීය. මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියනලද දේවලින් විනිශ්චයකරනු ලැබුවෝය. සමුද්‍රය එහි උන් මළවුන් පාවා දුන්නේය. මරණයත් පාතාලයත් එහි උන් මළවුන් පාවාදුන්නෝය. ඔව්හු එකිනෙකා තම තමාගේ ක්‍රියා ලෙස විනිශ්චයකරනු ලැබුවෝය. මරණයත් පාතාලයත් ගිනිවිලට හෙලනලද්දේය. මෙය දෙවෙනි මරණයය. එනම් ගිනිවිලය. යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බවීද ඔහු ගිනිවිලට හෙලනු ලැබුවේය" (එළිදරව් 20:11-15).**

දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය නොතැබුවාවූ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පාප කමාව නොලැබුවාවූ සියලු දෙනා ගිනි විලට හෙලනු ලැබේ. මෙය නම් අති භයංකර විනිශ්චයකි. නිරය නැමති ගිනිවිල පිළිබඳව ශුද්ධ බයිබලයේ තැන් බොහෝමයක සඳහන්කර තිබේ. එවැනි තැන්වල සඳහන් විස්තර කිහිපයක් මෙසේයි.

| | | |
|---|---|---|
| ලුක් 16:28 | - | වේදනා ඇති ස්ථානයක් |
| එළිදරව් 20:1 | - | පතුල නැති වල (පාතාලය) |
| එළිදරව් 20:15 | - | ගිනිවිල |
| යෙසායා 33:14 | - | සදාකාල දැවීම |
| මතෙව් 8:12 | - | හැඬීම සහ දත්මිටි කෑම ඇති ස්ථානය |
| යූද් 13 | - | අන්ධකාරයේ කළුවරකම ඇති තැන |
| එළිදරව් 14:11 | - | දිවා රෑ නිවාඩු නොලබන තැන |
| මාර්ක් 9:48 | - | පණුවා නොනසින තැන |
| | | (ආත්මය නොමැරී විඳවන තැන) |
| මතෙව් 25:46 | - | සදාකාල දඬුවමේ ස්ථානය |
| ලුක් 16:27 | - | නිෂ්ඵල යාච්ඤාවේ ස්ථානය |

නිරය පිළිබඳව වූ ඉහත විස්තරය මගින් අපට පසක් වන්නේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැරකම පිළිබඳව නොවේද? **“ඇත්තෙන්ම දෙවියන්වහන්සේගේ අත්වලට අසුවීම භයානක දෙයක්ය” (හෙබ්‍රෙව් 10:31).**

## 4 වන පරිච්ඡේදය

# ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රඥාව

**"උන්වහන්සේගේ හිසද හිසකේ ද සුදු ලොම් මෙන් සුදුය. උන්වහන්සේගේ ඇස් ගිනි දැල්ලක් හා සමානය (එළිදරව් 1:14).** තම හිසකේ සුදු වීම ලොවට නොපෙන්වීමට ඇතැමෙක් උත්සාහ දරයි. එයට විවිධ හේතු තිබිය හැක. ඉන් එක් හේතුවක් වනුයේ තමා වයස් ගත වන බව පෙන්වීමට තිබෙන අකැමැත්තයි. මන්ද වියපත් වූ පුද්ගලයෙකුගේ හිසකෙස් බොහෝ විට සුදු පැහැවේ. යේසුස්වහන්සේගේ හිස කෙස් සුදු ලොම් සහ හිම මෙන් සුදුව තිබීමෙන් අප වෙත සන්නිවේදනය වන සත්‍යතාවය කුමක් විය හැකිද? උන්වහන්සේගේ හිසෙහි එක කළු රොදක්වත් නොමැතිව සහමුලින්ම සුදු වර්ණව තිබීම යොහන් දුටුවේය. ඉන් පිළිඹිබු වන **සරලම** සත්‍යතාවය **නම් විශ්වයේ වසන අති වියපත්ම** පුද්ගලයා උන්වහන්සේ බවයි. මේ අදහසට සරිලන නාමයකින් උන්වහන්සේව හැඳින්වෙන බව දනියෙල් 7:9 හි අපි කියවමු. **"මා බලාසිටින අතර සිංහාසන පිහිටුවා, පුරාතන කෙනෙක් වැඩිවුණේය. උන්වහන්සේගේ වස්ත්‍ර හිම මෙන් සුදුව තිබුනේය. උන්වහන්සේගේ හිසකේ පිරිසිදු ලොම් මෙන්ය".**

මෙම දේව වචන කොටසෙහි සඳහන් පුරාතන තැනැන්වහන්සේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. ඇත්තෙන්ම මෙම විශ්වයෙහි පුරාතන තැනැත්වහන්සේ ලෙස උන්වහන්සේව හැඳින්වෙන්නේ විශ්වය මැවීමටත් ප්‍රථමයෙන් උන්වහන්සේ වැඩ සිටි නිසාය. උන්වහන්සේගේ මෙම පුරාතන භාවය යොහන් 1:1 සහ යොහන් 8:58 වැනි දේව වචන කොටස් තුලින් පැහැදිලි ලෙස පෙනේ.

මිනිස් දිවියෙහි මහලු විය පිළිබඳව කණගාටුදායක සත්‍යතාවයක් තිබේ. එනම් ජීවිත ගැටළු සහ ප්‍රශ්ණ පිළිබඳව වියපත් පුද්ගලයා සතුව පිළිතුරු සහ ඔවදන් තිබෙන නමුත් ඒවා ලබා ගැනීම පිණිස යොවුන් පරපුරේ ඇති නොකැමැත්තයි. ප්‍රශ්ණයට පිළිතුරු වියපත් පුද්ගලයා දන්නා නමුත් කිසිවෙකු ඔහුගෙන් ප්‍රශ්ණ අසන්නේ නැත. වියපත් පුද්ගලයා අත්දැකීම කරණකොටගෙන තමා සතු වූ ප්‍රඥාවෙන් පිරී සිටියි. මහලු වයසේ වාසිය එයයි. අපට ජීවිත ගැටළුවක් ඇති විට හිස පැසුණු කෙනෙකුගෙන් විමසන්නේ නම් එය නුවණට හුරුය.

යේසුස්වහන්සේගේ හිසද හිසකෙස් සුදු පැහැව තිබීමෙන් උන්වහන්සේ තුල ප්‍රඥාව තිබෙන බව අපට සිහිපත් කරවයි. **"ඒ තැනැන්වහන්සේ(යේසුස්වහන්සේ) තුල ප්‍රඥාවෙත්, දැනගැන්මෙත් සියලු වස්තු නිධාන කර ඇත්තේමය" (කොලොස්සි 2:3).** අප දකින සංකීර්ණ විශ්වය මැවීමෙහිලා වූ අති මහත් ප්‍රඥාව ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සතුය. **"උන්වහන්සේ (යේසුස්වහන්සේ) කරණකොටගෙන සියල්ල සාදන ලද්දේය. සාදන ලද කිසිවක් උන්වහන්සේ නැතුව සාදනු නොලද්දේය"** යයි යොහන් 1:3 හි ලියා තිබේ. මැවීමේ කතෘතුමා උන්වහන්සේය. **"සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ" (කොලොස්සි 1:16).**

පරක් තෙරක් නොපෙනෙන මේ මහ විශ්වයේ කෝටි සංඛ්‍යාත සූර්යන් මවන ලද්දේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙනය. අප සූර්යග්‍රහ මණ්ඩලය පිහිටා ඇති මන්දකිණිය, ක්ෂීරපථය නමින් හැඳින්වේ. එහි තරකා ගණන කියා නිම කල නොහැකි තරම්ය.

ඒ හැම තාරකාවක්ම සූර්යයෙකි. දැනට සොයාගෙන ඇති විශාලම සූර්යයා සහ අපට ආලෝකය දෙන සූර්යා අතර ඇති විශාලත්වයේ වෙනස කෙතරම් දැයි කියතොත් අඟල් 1,1/2 ක විශ්කම්භයක් ඇති ගොල්ෆ් බෝලයකින් අප සූර්යා පිලිඹිබු කරන්නේ නම් දැනට අප හඳුනාගෙන ඇති විශාලම සූර්යා හිමාලය කඳු දෙකක් එක පිට එක තැබූ විට එන දුර ප්‍රමාණය මෙන් විශ්කම්භයකින් යුතු වේ. විශ්වයේ ඇති තොරතුරු අප තවම දැනගෙන තිබෙන්නේ අල්ප මාත්‍රයක් පමණී. විශ්වයේ ඇති සියලු වස්තූන් පද්ධති වශයෙන් පිහිටා තිබේ. ඒවායේ ගමන් මඟ හැමෙකක්ම ඉතා ක්‍රමවත්ව පවතී. තත්පරයෙන් 1/100 එකකට නිවැරදිව භ්‍රමණය වන මෙම තරකා පද්ධති නිර්මාණය කිරීමට කෙතරම් සංකීර්ණ ප්‍රඥාවක් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට තිබිය යුතු නොවේද? පරක් තෙරක් නැති විශ්වය දෙස මෙන්ම අප සිරුරේ ඇති එක ශෛලයක් දෙස විමසිලිමත්ව බැලුවහොත් එහි ඇති සංකිර්ණභාවය මෙන්ම ක්‍රමවත් භාවය දැක ගත හැකි වෙයි. එක ශෛලයක් තුළ සිදුවන රසායනික විපර්යාසය පිළිබඳව සටහන් තැබීමට පොත් අටුවාවක් අවශ්‍ය කරනු ඇත. අපගේ ඇසට නොපෙනුනත් අප අවට පරිසරයේ ජීව රසායනික ක්‍රියා සහ ප්‍රතික්‍රියා මිලියන ගණනක් සිදු වෙමින් පවතියි. එසේ වීමට සැලසුම් කෙරුවේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින්ය. උන්වහන්සේගේ ප්‍රඥාව අති මහත්ය. උන්වහන්සේට මෙම විශ්වයේ සෑම තැනකම සිදුවන සෑම දෙයක්ම එකවිට පෙනේ. එසේ නම් එක මිනිස් සිතක් තුළ ඇති දෑ ඊට කොපමණ වැඩියෙන් නොපෙනෙන්නේද? ඒ පිළිබඳව ගීතිකාකරුවා ගීතාවලිය 139 හි මෙසේ සඳහන් කර තිබේ. **"ස්වාමීනී ඔබ මා විමසා බලා දැනගත් සේක, ඔබ මාගේ හිඳීමද නැඟිටීමද දන්නා සේක. දුරදීම මාගේ සිතුවිල්ල ඔබට තේරෙයි. ඔබ මාගේ ගමනත් සයනයත් විමසා බලන සේක. මාගේ සියලු මාර්ග දැනගෙන සිටින සේක. මක්නිසාද ස්වාමිනී ඔබ මුළුමනින්ම**

**නොදන්නාවූ කිසිවක් මාගේ දිවේ නැත්තේය" (ගීතාවලිය 139:1-4).**

මේ හේතුව නිසා අපගේ ජීවිතවල ඇති කිසිදෙයක් යේසුස්වහන්සේගෙන් සැඟවීමට අප ගන්නා උත්සාහය නිෂ්ඵල එකක් වේ. යේසුස්වහන්සේව මුණගැසීමට පැමිණි නතානියෙල් නම් පුද්ගලයෙක් පිළිබඳව යොහන් 1:47 සඳහන් වී තිබේ. යේසුස්වහන්සේ ඔහු දෙස බලා **"මෙන්න සැබවින්ම ඉශ්‍රායලිතයෙක්! මොහු තුල කිසි වංචාවක් නැත"** යි පැවසූ සේක. උන්වහන්සේ එසේ කිවේ ඔහුගේ සිතේ ස්වභාවය උන්වහන්සේට පෙණුනු නිසායි. තවද ඉන්පසු යේසුස්වහන්සේ පැවසූ දෙයින් ඔහු විශ්මයට පත්විය. **"පිලිප් නුඹ කැඳවන්නට පළමුවෙන් අත්තිකා ගස යට නුඹ සිටියදී නුඹ දුටිමි" (යොහන් 1:48).** අපගේ ජීවිතකාලය පුරා අප කරන කියන හැම දෙයක්ම දෙවියන්වහන්සේ දකින සේක. **"උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ නොවූ කිසි මැවිල්ලක් නැත. උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි සියල්ල වැස්මක් නැතුව ඇරී තිබේ. අපෙන් ගණන් ගන්නේ උන්වහන්සේය" (හෙබ්‍රෙව් 4:13).** අප අනුගමනය කරන්නේ මෙවන් අද්විතීය අසමසම ප්‍රඥාවෙන් හෙබි යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. පත්මොස් දූපතෙහි උන්වහන්සේ යොහන්ට එළිදරව් වූ අවස්ථාවේ උන්වහන්සේගේ හිස කෙස් සුදු පාටට පෙනීමෙන් අදහස් කරන්නේ උන්වහන්සේගේ ඉහත කී ප්‍රඥාවයි. මේ නිසා අපගේ ජීවිත නිසි මඟ ගෙනයෑම සඳහා අපට මඟ පෙන්වීමට උන්වහන්සේට බොහෝසෙයින් හැකියාව තිබේ. එබැවින් අප අපගේම නුවණ කෙරෙහි පිහිටා නොසිට අපගේ ජීවිතයේ ලොකු කුඩා සැම කටයුත්තකදීම යේසුස්වහන්සේගේ මඟ පෙන්වීම ඉල්ලාසිටීම ඉතා සුදුසුය. **"නුඹේම නුවණෙහි නොපිහිටා නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න. නුඹේ සියලු මර්ගවලදී උන්වහන්සේ සලකාපන්න. එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලා කරනවා ඇත" (හිතෝපදේශ 3:5,6).**

### 5 වන පරිච්ඡේදය

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නිර්මල ශුද්ධත්වය

**"උන්වහන්සේගේ හිසද හිසකේ ද සුදු ලොම් සහ හිම මෙන් සුදුය" (එළිදරව් 1:14).**

යේසුස්වහන්සේගේ හිස කෙස් පමණක් නොව හිසද සුදු පැහැයෙන් යුතු බව ඉහත පදයේ සඳහන් වේ. මෙය අසාමන්‍ය දර්ශණයකි. හිසකෙස් සුදු පැහැව තිබීමෙන් යේසුස්වහන්සේගේ ප්‍රඥාව සිහිගැන්වෙන්නාක් මෙන්ම උන්වහන්සේගේ හිස සුදු පැහැයෙන් යුතුව තිබීමෙන් උන්වහන්සේගේ පාරිශුද්ධභාවය පිළිඹිබු කරයි.

හිස සුදු පැහැයෙන් යුතුව තිබීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සිතේ ස්වභාවය පිළිඹිබු කරවන නිසා උන්වහන්සේගේ එම සුපිරිසිදු සිත පිළිබඳව උගෙනීම යෝග්‍ය වේ. මන්ද **"ක්‍රිස්තුස්වහන්සේ තුල තිබුණු සිතම නුඹලා තුලත් තිබේවා"** යයි පිලිප්පි 2:5 හි සඳහන්ව තිබේ. මිනිස් අපගේ සිතෙහි දුක්ඛිත තත්වය පිළිබඳව යෙරෙමියා 17:9 හි සඳහන්ව ඇත්තේ එය **"සියල්ලට වඩා රැවටිලිකාරව සහ දුෂ්ඨව"** තිබෙන බවයි. එහෙත් ස්වාමීවූ යේසුස්වහන්සේගේ සිත ඊට හාත්පසින්ම වෙනස්ය. උන්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමයේ වැදගත් පැතිකඩකි උන්වහන්සේගේ මේ සුපිරිසිදු සිත, උන්වහන්සේගේ සුපිරිසිදු චරිතය, උන්වහන්සේගේ සුපිරිසිදු සිතේ ප්‍රතිරූපණයකි. උන්වහන්සේට පාපය සමඟ කිසිදු නෑදෑකමක් නොමැති බව ශුද්ධ බයිබලය අපට උගන්වයි.

"අප උන්වහන්සේ තුල දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස **පාපයක් නොදත්තාවූ** උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට දෙවියන්වහන්සේ සැලැස්වූ සේක" (2 කොරින්ති 5:21).

**"උන්වහන්සේ කිසි පාපයක් නොකළ සේක" (1 පේතෘස් 2:22).**

**"**මට **පාපය ඇතැයි** නුඹලාගෙන් කවරෙක් ඔප්පු කෙරේද?**" (යොහන් 4:48).**

මෙම පැණයට පිළිතුරු දීමට කිසිවෙකු ඉදිරිපත් වූයේ නැත. එනම් උන්වහන්සේ තුළ කිසි පාපයක් තිබුනේ නැත.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ශුද්ධ බයිබලය තුලින් එළිදරව් වන ප්‍රමුඛ ලක්ෂණය නම් උන්වහන්සේගේ පාරිශුද්ධ භාවයයි. මෙලොව ජීවත්වූ සෙසු සියලු මිනිසුන්ට වඩා උන්වහන්සේ සුවිශේෂී වන්නේ මොන හේතුව නිසාද? මෙලොව බිහිවූ සෑම මිනිසෙකුම පව්කාර ස්වභාවයක් උරුමකරගෙන ඉපදුනි. එහෙත් යේසුස්වහන්සේට එම පාපකාරී ස්වභාවය උරුම නොවූයේ කෙසේද? ඒ උන්වහන්සේට භූමික පියෙකු නොසිටි නිසාය. උන්වහන්සේව මරියා නැමති ස්ත්‍රියගේ කුසේ පිළිසිඳගනු ලැබුවේ ඇය කන්‍යා අවස්ථාවේ සිටිය දී බව ශුද්ධ බයිබලය ප්‍රකාශ කරයි. **"බලව කන්‍යාව ගර්භනීව පුත්‍රයෙකු වදා එම්මානුවෙල් යන නම ඔහුට තබන්නීය"** යනුවෙන් යෙසායා 7:14 හි සඳහන් අනාගතවක්‍ය සම්පූර්ණ විය. යේසුස්වහන්සේගේ උපත ගැන කන්‍යාවක් වූ මරියාට ගාබ්‍රියෙල් දේවදූතයා විසින් ප්‍රකාශ කලේ එයමය. **"ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ අනුභාවය**

**නුඹ වසාගන්නේය, ඒ නිසා උපදින්නට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක" (ලූක් 1:35).**

අපගේ පාපය වෙනුවෙන් වන්දි මිලය ගෙවීම පිණිස සුදුස්සෙකු වීම සඳහා ඉහත කී සුපිරිසිදු භාවය අති වැදගත්ය. පව්කාර ස්වභාවය ඇති කිසිවෙකුට තවත් කෙනෙකුගේ පාප වෙනුවෙන් වන්දි මිලයක් ගෙවීමට නොහැකිය. පරණ ගිවිසුම් අඥා යටතේ පාප පූජාවක් පිණිස ඔප්පු කල බැටළුවා කැලැල්ලක් නැති බැටළුවෙකු විය යුතු යයි නියම කර තිබුනේ පරිශුද්ධ නිර්මල භාවය සංකේතවත් වන පිණිසය. "මෙන්න ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ" යයි යොහන් බෞතිස්ත යේසුස්වහන්සේ ගැන කෑගසා පැවසුයේ උන්වහන්සේ කැලැළක් හෝ පළුද්දක් හෝ නැති පාප පූජාවේ බැටළු පැටවාට සමාන කරමිනි. ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබුනාවූ මෙන් සුපිරිසිදු සිතක් අපද ඇතුව සිටීමට අභියෝගයක් අප ඉදිරිපිට තිබේ. පාපකාරී සිතුවිලි වලින් අපවිත්‍ර වීමට සිතට ඉඩ නොදී එය ආරක්ෂා කර ගැනීම අපට පැවරී ඇති වගකීමයි. **"සියල්ලට වඩා නුඹේ සිත ආරක්ෂා කර ගන්න. මක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය" (හිතෝපදේශ 4:23).** පාප වල ආරම්භය සිත බව ස්වාමීවූ යේසුස්වහන්සේ පැවසූ සේක. මේ නිසා ඉහත කී ආකාරයට සිත ආරක්ෂා කර ගැනීම ඇදහිලිවන්ත යෙකුගේ වගකීමයි. කිසි පාපයක් නොදත්, කිසි පාපයක් නොකල, කිසි පාපයක් නොතිබුණු යේසුස්වහන්සේ, තම අනුගාමිකයන් වන අපගෙන් බලාපොරොත්තු වන්නේ එවන් ජීවිතයකි.

## 6 වන පරිච්ඡේදය

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වචනය සහ කටහඬ

**"උන්වහන්සේගේ ශබ්දය බොහෝ ජල ඝෝෂාවක ශබ්දය මෙන්ය"**
**(එළිදරව් 1:15)**
**"උන්වහන්සේගේ මුඛයෙන් දෙමුහත් තියුණු කඩුවක් නික්මුනේය"**
**(එළිදරව් 1:16)**

ස්වාමීවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ මහිමයේ දර්ශණය තුල මීළඟට අපගේ අවධානය යොමුවන්නේ තවත් සුවිශේෂී කරුණක් වෙතයි. දෙමුහත් තියුණු කඩුව සැමවිටම දෙවියන්වහන්සේගේ වචනය පිළිබිඹු කරයි. **"දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය බලවත්ය කොයිම දෙමුහත් කඩුවකට වඩා තියුණුය, ප්‍රාණය සහ ආත්මයද සන්ධි හා ඇටමිදුළුද වෙන් කරන තරමට කා වදින්නේය. සිතේ සිතුවිලිද අදහස්ද විමසන්නේය" (හෙබ්‍රෙව් 4:12).** දෙවියන්වහන්සේගේ අභිප්‍රාය අපගේ ජීවිත තුල ඉටුකරලනු පිණිස අපගේ ජීවිත තුල ක්‍රියා කරන ප්‍රධාන සාධකය දෙවියන්වහන්සේගේ වචනයයි. පසුතැවිලිවීම සඳහා සිතට කථා කිරීම, ප්‍රඥාව සඳහා සිත අලෝකමත් කිරීම සහ සදාකල ජීවනය උදෙසා අප ආත්මයට ජීවය ගෙන ඒම යන දෑ ඉටුකරනු ලබන්නේ දෙවියන්වහන්සේගේ වචනය මගින්ය. එමෙන්ම **"මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියලු වචන වලින් ජීවත් වෙනවා මිස රොටි පමණකින් ජීවත් නොවේ"** යයි මතෙව් 4:4 හි සඳහන් වේ. එනම් දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීමෙන් අප තුළට පැමිණි ස්වර්ගීක ජීවනය ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා දෙවියන්වහන්සේගේ වචනය ක්‍රියා කරයි. කොටින්ම කියතොත්

දෙවියන්වහන්සේ වෙතින් මිනිසාට ලැබෙන සියලු ආත්මික සහ ස්වර්ගීක ආශිර්වාද ඔහු වෙතට ලඟා වන්නේ දෙවියන්වහන්සේගේ වචනය කරණකොටගෙන යයි කීම අතිශෝක්තියක් නොවේ.

## දෙවියන්වහන්සේගේ කටහඬ

**"මෝසෙස් උන්වහන්සේ සමඟ කථාකරන පිණිස සම්මුඛවීමේ කූඩාරමට ඇතුල් වන කල සාක්ෂි පෙට්ටිය පිට තිබෙන කරුණාසනය උඩ සිට කෙරූබ්වරුන් දෙදෙනාට අතරින් තමාට කථා කරන හඬ ඔහුට ඇසුනේය" (ගණන් කථාව 7:89).**

පරණ ගිවිසුම් කාලයේදී දෙවියන්වහන්සේගේ කටහඬ අසා ගැනීමට මෝසෙස් සමත් විය. ඒ ඉහත බයිබල් පදයේ සඳහන් ආකාරයටයි. එහෙත් වර්ථමානයේදී ඇදහිලිවන්තයන් වන අපට දෙවියන්වහන්සේගේ කටහඬ ඇසෙන්නේ කනට නොව සිතටයි. ඒ සඳහා අපට උපකාර වන්නේ දෙවියන්වහන්සේගේ ලියන ලද වචනයයි. එනම් ශුද්ධ වූ බයිබලයයි. අප ශුද්ධ බයිබලය කියවන විට දෙවියන්වහන්සේගේ කටහඬ අපගේ හදවත තුලට ඇසෙයි. මෙය ආත්මික සහ අභිරහස්මය අත්දැකීමකි. හෙබ්‍රෙව් 4:12 හි සඳහන් පරිදි එය අපගේ ආත්මය සහ ප්‍රාණය වෙන් කරන තරමට කාවදින දෙවියන්වහන්සේගේ වචනයයි. වර්ථමාන ඇදහිලිවන්තයන් තුල ආත්මික සහ ප්‍රාණීක දේ අතර ඇති වෙනස පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැති බව ඔහුගේ ක්‍රියා කලාපයෙන් පෙනී යයි. අපගේ ආත්මය කරණකොටගෙන දෙවියන්වහන්සේට නමස්කාර කලයුතු නමුත් ප්‍රාණීක අත්දැකීම් ඔස්සේ යමින් ශුද්ධ නමස්කාරය වියැවුල් විකාරයක් බවට හරවා ගැනීමට තරම් ඇදහිලිවතුන් නොමග ගොසින්ය. මෙයට හේතුව දෙවියන්වහන්සේගේ වචනය අවශ්‍ය ප්‍රමාණයට අප හදවත තුල ක්‍රියා නොකිරීමයි. දෙවියන්වහන්සේගේ ලියා

ඇති වචනය කියවීමෙන් දිනපතා උන්වහන්සේගේ කටහඬ අසනවා වෙනුවට මිනිසුන් පවසන "අනාගතවාක්‍ය" අසන්නට ඇදහිලිවතුන් දැඩි රුචියක් දක්වති. මෙය අභාග්‍යසම්පන්න තත්වයකි. අපගේ ආත්මය තුල දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ හැකියාව ගැබ්වී තිබේ. එහෙත් අපගේ ප්‍රාණය තුල ඇත්තේ හැඟීම්, බුද්ධිය සහ තම අභිමථාර්තයයි. හැඟීම් නමස්කාරයට උපකාරයක් සහ සැරසිල්ලක් මිස නමස්කාරයේ වාහනය හැඟීම් නොවේ.

නමස්කාරය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ගත යුත්තේ අපගේ ආත්මයයි. දෙවියන්වහන්සේට නමස්කාර කරන්නන් සැබෑ කමින් සහ ආත්මයෙන් නමස්කාර කල යුතු බව යොහන් 4:23 ලියා තිබේ. වර්ථමාන කිතුණු ඇදහිලිවතුන්ට මෙය අතිශයින් වැදගත්ව තිබෙන්නේ මේ නිසාය.

යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගීට්මේ මහිමය පිළිඹිබු කරන එක් ලක්‍ෂණයක් ලෙස දෙමුහත් තියුණු කඩුවක් උන්වහන්සේගේ මුඛයෙන් නික්ම ඒමේ දර්ශණය අති වැදගත් එකකි. දෙවියන්වහන්සේගේ කටහඬ අපගේ හදවත තුල අසා ගත්තේ නැතිනම් අපි අසාර්ථක ඇදහිලිවන්තයන් බවට පත් වන්නෙමු. ආත්මික ඇදහිලිවන්තයන් වීමට නම් උන්වහන්සේගේ කටහඬ අනිවාර්යයෙන්ම අපගේ ආත්මය තුල අසාගත යුතුය. ඒ සඳහා දිනපතා බයිබලය කියවිය යුතුය. **"දෙවියන්වහන්සේගේ කටහඬ බලවත් බවත් මහිමයෙන් පූර්ණ බවත්"** ගීතාවලිය 29:4 ලියැවී තිබේ. කිහිරි ගස් බිඳහෙළන, ලෙබනොන් සහ සිරියොන් සොලවන, ගිනිදැල් බෙදන, වනාන්තර දෙදරවන දෙවියන්වහන්සේගේ කටහඬ අපගේ හදවතද බිඳෙන්නට සලස්වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ ක්‍රියාව අප තුල ඉටු කරවන සේක. දෙවියන්වහන්සේගේ කටහඬේ බලය පිළිබඳව දැනගැනීමට ගීතාවලිය

29 කියවන්න. “කන් ඇත්තේ අසාවායි” යේසුස්වහන්සේ බොහෝ වර පැවසූ සේක. අපට කන් තිබෙන නුමුත් දෙවියන්වහන්සේගේ වචනය තුලින් උන්වහන්සේගේ කටහඬ ඇසීමට මැලිවන්නේ නම් ඒ මොන තරම් අභාග්‍යයසම්පන්නද? **“ගෝලයන් මෙන් ඇසීමට උන්වහන්සේ උදයක් පසා පුබුදුවන සේක, මාගේ කන පුබුදුවන සේක” (යෙසායා 50:4).**

කරුණු මෙසේ හෙයින් දිනපතා ක්‍රමානුකූල ලෙස බයිබලය කියවීම හැම ඇදහිලිවන්තයෙකුටම අත්‍යාවශ්‍ය ක්‍රියාවකි. මන්ද බයිබලය කියැවීමෙන් තොරව ස්වාමීන්වහන්සේගේ කටහඬ ඇසීමට නොහැකිවන හෙයිනි. මේ නිසා ඔබත් දිනපතා දණින් හිඳ බයිබලය කියවන්න. බයිබලය පරිච්ජේද 1189 කින් සමන්විත වේ. එම නිසා දිනකට පරිච්ජේද 3ක් කියැවීමෙන් වසරකින් පමණ බයිබලය එක් වතාවක් කියවා නිමකල හැකිය. දිනකට 3 වරක් පමණ ශරීරයට ආහාර ලබා ගන්නාවූ අප ආත්මයටත් අවශ්‍ය කරන ආත්මික ආහාරය ලබා දිය යුතු නොවන්නේද? **“මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියළු වචනවලින් ජීවත් වෙනවා මිස රොටි පමණකින් ජීවත් නොවේ”** යැයි ස්වාමීවූ යේසුස්වහන්සේ පැවසූ වදන් වලින් අදහස් වූයේ අපගේ ආත්මයට ලබා දිය යුතු ජීවනයේ ආහාරය පිළිබඳවයි. සදාකාලික ආත්මය මනාව සමෘධිමත් විම, ශක්තිමත්වීම තාවකාලික ශරීරයෙහි නීරෝගි බවට වඩා වැදගත්ය. එබැවින් දිනපතා දේවවචනය කියැවීම මගින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කටහඬ ඔබගේ හදවත තුල අසා ගැනීමට ඔබත් අදම තීරණය කරගන්න.

## 7 වන පරිච්ඡේදය

# ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දීප්තිය සහ අලංකාරය

**"උන්වහන්සේගේ මුහුණ තදින් බබලන සූර්යයා මෙන්ය" (එළිදරව් 1:16).**

මිහිපිට සිටින අප දන්නාවූ ප්‍රබලතම ආලෝකය සූර්යයා. එහි දීප්තිය දස අත විහිදෙයි. යේසුස්වහන්සේගේ මුහුණේ දිප්තියත් එයාකාරව තිබෙණු යොහන් තුමා දිටීය. එහි අන්ධකාරයක් තිබුණේ නැත. ඇත්තේ පූර්ණ ආලෝකය පමණී. උන්වහන්සේගේ මුහුණ තදින් බබලන සූර්යා මෙන් දිප්තිමත්ව තිබීමෙන් අදහස් වනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිප්තිමත් අලංකාර චරිතයයි. එම චරිතය අධ්‍යයනය කර අනුගමනය කිරීම සෑම කිතුණු ඇදහිලිවන්තයෙකු විසින්ම කල යුතු දෙයකි. **"මම ලෝකයේ ආලෝකය වෙමි"** යි පැවසූ තැනැන්වහන්සේම (යොහන්8:12) **"නුඹලා ලෝකයේ ආලෝකය" යයි පැවසූ සේක** (මතෙව් 5:14). අද අප විසින් ලෝකයා වෙතට පරාවර්ථනය කල යුත්තේ යේසුස්වහන්සේගෙන් අප ලබාගන්නාවූ ආලෝකයයි. චන්ද්‍රයාට තමා තුළම ආලෝකයක් නැතත් සුර්යයාගෙන් ලැබෙන ආලෝකය පරාවර්ථනය කරනු ලබන බැවින් රාත්‍රි භාගයේ ලොවට එළිය දීමට චන්ද්‍රයාට හැකියාව ලැබෙයි. ඇදහිලිවන්තයාද එසේ විය යුතුය. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ චරිත ගුණාංගය කොපමණ හොඳින් අපි හඳුනාගත්තෙමුද? කිතුණුවන් තම චරිතය සහ ජීවිත

රටාව මඟින් යේසුස්වහන්සේට වඩා බොහෝ දුරට වෙනස් වීම අද පවතින විශාල ගැටළුවයි. "ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන්නේ නම් ඔබගේ ජීවිතය තුල යේසුස්වහන්සේගේ ගතිගුණ නැත්තේ ඇයි" දැයි ලෝකයා අපගෙන් ප්‍රශ්ණ කරයි. කිතුණු ඇදහිලිවන්තයෙකුට අප සමාජය තුල තිබුණු ගෞරවය සහ සාක්ෂිය හීන වී ගොසින්ය. මෙයට වගකිව යුත්තේ අපමය. ඇදහිලිවන්තයෙකු ලෙස ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ චරිතයේ ආලෝකය ලෝකයාට පරාවර්ථනය කිරීමට අපි ඇප කැප විය යුතුවෙමු. මා ඉහත කී මේ කරුණු පැහැදිලි කර ගැනීමෙහි ලා රෝම 15:1-7 හි ඇති ශු.ලියවිලි කොටස ප්‍රයෝජනවත් වේ. එම කොටසෙහි 3 වතාවක් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අපගේ අනුගමනය පිණිස ඉදිරිපත් කර තිබේ.

1 **"ක්‍රිස්තුස්වහන්සේද තමන් සතුටුකර නොගත්සේක" (රෝම 15:3).**
2 **"ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය ලෙස නුඹලා එකිනෙකා සමග එක්සිත්ව සිටින්න" (රෝම 15:6).**
3 **"ක්‍රිස්තුස්වහන්සේ නුඹලා පිළිගත් ලෙසම නුඹලා එකිනෙකා පිළිගනිල්ලා" (රෝම 15:3).**

මෙම ආදර්ශ පාඨ 3 මදක් විමසා බැලීම මඟින් ක්‍රිස්තුස්වහන්සේගේ චරිතයේ දීප්තිමත් භාවය මනාව ප්‍රකාශ වේ. අප තුලින් විහිද යා යුත්තේද එවැනිම චරිතයකි.

## ක්‍රිස්තුස්වහන්සේ තමන්ම සතුටු කර නොගැනීම (රෝම 15:3)

ස්වාමීවූ යේසුස්වහන්සේ මෙලොවෙහි ජීවත්වූ කාලය පිළිබඳව ශුභාරංචි පොත් සතරෙහි සහ යැවුම්පත්‍ර වල මනා විස්තරයක් කර තිබේ.

2. කොරින්ති 5:22 - **"පාපයක් නොදත්තාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්නට දෙවියන්වහන්සේ සැලැස්වූ සේක".** පාපයක් නොදත්තාවූ තැනැන්වහන්සේ පාපය බවට පත්වීම සුළුපටු කරුණක් යැයි ඔබ සිතන්නේද? ක්‍රිස්තුස්වහන්සේ තමන්ම සතුටු කර ගනිමින් සිටි සේක් නම් එවැනි දෙයකට කිසි දිනෙක ඉඩ නොදෙනු ඇත. අප කිසිවෙකු අසූචි පිරි ජරා වලකට එක මොහොතකට හෝ බසින්නට කැමති වන්නේ නැත. යේසුස්වහන්සේගේ පාරිශුද්ධත්වය සමග සසඳන විට මේ ලෝකය පාපයෙන් පිරි පිළිකුල් වලක් හා සමානය. එහෙත් උන්වහන්සේ මේ ලෝකයට පැමිණීමට කැමති වූ සේක. එසේ පැමිණි විට උන්වහන්සේ හාත්පස වටකර සිටියේ පව්කරුවන්ය. ඔවුන් සැමගේ පාපකාරී සිත උන්වහන්සේ ඉදිරිපිට ප්‍රදර්ශණය වෙමින් තිබුණි. එහි සිටි එකම ශුද්ධ තැනැන්වහන්සේ යේසුස්වහන්සේ පමණකි. එතකින් නොනැවතුණු උන්වහන්සේ තමන් අවට සිටි ඒ සියලු පව්කරුවන්ගේද එදා මෙදා තුර ලෝකයේ ජීවත් වූ සියළු මිනිසුන්ගේද පාප කන්දරාව තම සිරුරමත දරාගන්නට කැමතිවූ සේක. කුරුසියේ ඇණ ගසා සිටි විට දෙව්පියාණන්වහන්සේට උන්වහන්සේ පෙණුනේ එකම පාප ගුලියක් ලෙස විය හැකිය. **"කිසි පාපයක් නොදත්තාවූ තැනැන්වහන්සේ පාපය වෙන්ට"** කැමති වූ සේක. අනුන්ගේ පාපවල වන්දිය තමන් පිට ගැනීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කල අනර්ඝතම කර්තව්‍යයි. උන්වහන්සේ තමන්ම සතුටුකර ගත්තේ නම් අපේ පව්වලට වන්දි ගෙවීමේ වැඩය පසෙක

දමා යලි ස්වර්ගයට හැරී යාමට උන්වහන්සේට හොඳටම ඉඩකඩ තිබිණි. එහෙත් එසේ නොකොට පව්කරුවන් වෙනුවෙන් තම ජීවිතය වගුරුවන්නට උන්වහන්සේ කැමති වූ සේක. අපගේ අකල්පයත් ක්‍රියා කිරීමත් මේ ආදර්ශයට වඩා කොපමණ වෙනස්ද? අප නම් සැමවිටම කරන්නේ අපවම සතුටු කර ගැනීමයි. තවද අපම සුදනුන් කර ගැනීමට උත්සහ කිරීම අපගේ පොදු ලක්‍ෂණයකි. අනුන්ගේ වැරදි වෙනුවෙන් දුක් විඳීමට අපි නම් කොහොමටත් කැමති නොවෙමු. මේ තත්වය නිසා යේසුස්වහන්සේගේ චරිතාලංකාරය අප තුලින් ප්‍රදර්ශණය නොවී තිබේ.

මතෙව් 12:24 - **"නමුත් ඵරිසිවරු ඒ අසා මොහු යක්‍ෂාධිපතිවූ බෙල්සෙබුබ් කරණකොටගෙන මිස වෙන හැටියකින් යක්‍ෂයන් දුරු නොකරන්නේ යයි කීසේක".** එවන් කුරිරු වචන ඇසීම යේසුස්වහන්සේගේ සිත කොපමණ මහත් සන්තාපයකට පවත්කරන්නට ඇද්ද? එහෙත් උන්වහන්සේ තම සේවය අත් හැරියේ නැත. දිගටම කලේ එවන් කුරිරු මිනිසුන් හට යහපත කිරීමය. "නුඹට යක්‍ෂයකු වැහිලා" යයි යමෙක් ඔබට කිවහොත් ඔබ විසින් මොන විදියේ ප්‍රතිචාරයක් ඒ අයට දෙනු ඇද්ද? අප විසින් අපවම සතුටු කර ගැනීමේ කැමැත්ත නිසා අපට දෙස් පවරන අය සමඟ ඇසුරු කිරීමටත් අප අදි මදි කරන්නෙමු. මෙය අප චරිතයේ පෙනෙන විශාල අඩුපාඩුවකි. යේසුස්වහන්සේගේ චරිත දීප්තිය අපගෙන් පරාවර්ථනය නොවන්නේ මේ නිසායි.

මාර්ක් 3:21 - **"උන්වහන්සේගේ නෑයෝ ඒ අසා උන්වහන්සේට ඔල්මාදයයි කියා උන්වහන්සේ අල්ලන්ට ගියෝය".** එවැනි පහත් විවරණයක් ගැන උන්වහන්සේ උරණ වුයේ නැත. පසුකලෙක උන්වහන්සේගේ සහෝදරයෝ යේසුස්වහන්සේ අදහා ගැලවීම ලබා බලවත් දේව දසයින් බවට පත්වුහ. "නුඹට ඔල්මාද" හෝ "නුඹට

පිස්සු" යයි යමෙක් ඔබට සරදම් කරන්නේ නම් ඔබගේ ප්‍රතිචාරය කුමක් වෙයිද? එවැනි අයට දිගින් දිගටම යහපත කිරීමට ඔබ සූදානම්ද? එසේ නොමැතිව එවැනි අය "අතේ දුරින්" පමණක් තබා ගන්නට ඔබ කැමති වන්නේද? එසේ නම් ඔබ ඔබවම සතුටු කර ගන්නෙකි.

මතෙව් 11:19 - **"මනුෂ්‍යය පුත්‍රයා කමින් බොමින් ආවේය. බලව, කෑදර මනුෂ්‍යයෙක්ය, මුද්‍රික පානය බොන්නෙක්ය, සුංගම් අයකරන්නන්ගෙත් පව්කාරයන්ගෙත් මිත්‍රයෙක් යැයි ඔව්හු කියති".** "කෑදරයා" "බේබද්දා" වැනි දුෂ්ඨ චෝදනා යේසුස්වහන්සේට එල්ල කැරිණි. අපට එවන් චෝදනා එල්ල වූයේ නම් එවැනි දෑ කී මිනිසුන්ගේ මුහුණ බලන්නටවත් අප කැමති වන්නේ නැත. එහෙත් ස්වාමීවූ යේසුස්වහන්සේ කලේ කුමක්ද? දිගින් දිගටම ඔවුන් අතරේ සේවය කිරීමයි. අවසානයේදී උන්වහන්සේ අල්ලා කුරුසියේ ඇණ ගසා මරා දමන තුරුම උන්වහන්සේ යහපත කිරීම අත හැරියේ නැත. යේසුස්වහන්සේගේ චරිතයේ දීප්තිමත් බව එයාකාරයි.

යොහන් 7:53,8:1 - **"එවිට සියල්ලෝ තම තමුන්ගේ ගෙවලට ගියෝය. යේසුස්වහන්සේ ඔලීව කන්දට ගිය සේක".** මෙය කොතරම් කණගාටුදායක දර්ශණයක්ද? උදේ සිට සවස් වනතුරු දේවමාළිගාවේ සිට වචනය ඉගැන්වූ යේසුස්වහන්සේට රාත්‍රිය ගත කිරීමට තැනක් තිබුනේ නැත. වචනය ලබාගත් අය සවස් වන විට සතුටින් තම තමුන්ගේ ගෙවලට හැරී ගියෝය. යේසුස්වහන්සේට තිබුණේ ඔලීව කන්දයි. ගෙදරකට ආරාධනා කරණු ලැබූ අවස්ථා කිහිපයක හැර බොහෝ දිනවල උන්වහන්සේ ඔලීව කන්දේ ගහක් යට රාත්‍රිය ගත කරන්නට ඇත. අපි, ලබා ගන්නවා මිස දෙන්නට නොකැමති මිනිසුන් වී සිටිමු. යේසුස්වහන්සේ ගෙදරට කැදවාගෙන ගියොත් "කරදරයක්" යැයි ඇතමෙකු කල්පනා කරන්නට

ඇත. වර්ථමාන කාලයේ ඇතැම් දේශකයෝ දේශනාවලින් අනතුරුව වායු සමීකරණය කල කාමරයක් රාත්‍රිය ගත කිරීමට සොයති. හරිහැටි සැලකුවේ නැති නම් යලි එවැනි තැනකට ගොස් වචනය දේශනා කිරීමට ඔව්හු අකමැති වෙති. එහෙත් යේසුස්වහන්සේ කලේ කුමක්ද? **"උන්වහන්සේ අළුයම දේවමාලිගාවට නැවත ආසේක. මුළු සෙනග උන්වහන්සේ වෙතට පැමිණියේය. උන්වහන්සේ වැඩහිඳ ඔවුන්ට ඉගැන්වූසේක"** යයි යොහන් 8:2 හි ලියැවී ඇත. ඉහත බයිබල් පදය "උන්වහන්සේ වැඩහිඳ ඔවුන්ට හොඳටම දෙස් තැබූ සේක" යයි ලියැවුනා නම් සාධාරණයි. එහෙත් යේසුස්වහන්සේ තමන්ම සතුටුකර නොගත් හෙයින් තමන්ට කල නොසැලකිල්ල නොසලකා හැර දිගින් දිගටම වචනය ඉගැන්වීමෙහි යෙදි සිටි සේක. **"අළුයම නුවරට නැවත යන අතර උන්වහන්සේට බඩගිනි වීය" යයි** මතෙව් 21:18 ලියැවි තිබේ. අළුයම බඩගිනි විමේ හේතුව රාත්‍රියේ නිරාහාරව සිටීම විය හැක. එය සුළුපටු බඩගින්නක් නොවේ. කිසිවෙකු උන්වහන්සේට කෑම නොදුන් නිසා පාර අද්දර තිබූ අත්තික්කා ගහකින් ගෙඩියක් කඩාගෙන කන්නට උන්වහන්සේ සෙවීය. මෙලෙව බිහිවූ ශ්‍රේෂ්ඨතම දේශකයාණන්ට ලෝකයා සත්කාර කලේ එයාකාරයටය. අත්තිකා කගේ ගෙඩි නොතිබූ බැවින් කුසගින්නේම දේවමාළිගාවට ඇතුල්වූ උන්වහන්සේ රැස්වූ සෙනගට ඉගැන්වූ සේක. වර්ථමාන දේශකයන් වන අපි වේලාවට කෑම ටික නොලැබුනොත් ඉතා උරණ වන්නෙමු. සීනි අඩුවෙන්, ලුණු අඩුවෙන් එළවලු තෙල් යොදා සැකසූ ගුණවත්, රසවත් ආහාර වේලක් සොයමින් අද අපි අපවම සතුටුකර ගන්නෙමුව. එහෙත් අපගේ පරම ආදර්ශය වන යේසුස්වහන්සේ එයාකාර නොවේ.

## ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය ලෙස එකිනෙකා සමග එක්සිත්ව සිටීම (රෝම 15:6)

ස්වාමීවූ යේසුස්වහන්සේ තම ගෝලයන් සමඟ එක්සිත්ව ක්‍රියා කල අයුරු ශුභාරංචි පොත්වල දක්නට ලැබේ. උන්වහන්සේ සියළු ප්‍රඥාවෙන් පූර්ණ දෙවියන්වහන්සේ නමුදු තමන් තෝරාගත් නූගත් ගෝලයන් සමඟ එක්සිත්ව වැඩ කිරීමට කැමති වූ සේක.

මතෙව් 16:5-7 - **"ගෝලයෝ එගොඩට පැමිණියෝය. රොටි ගෙනයන්නට ඔවුන්ට මතක නැති වුණේය. යේසුස්වහන්සේ ඔවුන්ට කථාකොට ඵරිසිවරුන්ගේද සද්දුසිවරුන්ගේද මුහුන් වලින් ප්‍රවේශම් වෙන්ට බලාගනිල්ලා යයි ඔවුන්ට කීසේක. ඔව්හු අපි රොටි නොගෙනාවෙමු යයි තම තමුන් අතරේ කථා කරගත්තෝය".** ඵරිසිවරුන් සහ සද්දුසිවරුන්ගේ මුහුන් යනු කුමක්දැයි තේරුම් ගැනීමටවත් ගෝලයන්ට ප්‍රඥාව නොතිබුණි. ඔවුන්ගේ කල්පනාව තිබුනේ රොටි පිළිබඳවයි. අත්මික දේ පිළිබඳව එපමණ අන්ධ භාවයක් තිබියදී ඔවුන් සමඟ එක්සිත්ව සේවය කරමින් යේසුස්වහන්සේ අපට එක්සිත් කමේ ආදර්ශය සපයා දී තිබේ.

යොහන් 11:11-12 - **"උන්වහන්සේ මෙසේ කියා පසුව 'අපගේ මිත්‍රවූ ලාසරුස් සැතපී ඉන්නේය. ඔහු පුබුදුවන පිණිස යමි' යි ඔවුන්ට කීසේක. එබැවින් ගෝලයෝ උන්වහන්සේට කථාකොට 'ස්වාමීනී ඔහු සැතපී සිටී නම් ඔහුට සුවවේ' යයි කීවෝය".** ඉතා සුළු දෙයක් තේරුම් ගැනීමටවත් ප්‍රඥාවක් ගෝලයන්ට තිබුනේ නැත. ලාසරුස් නිදා ඉන්නවා නම් ඔහු කැමති වේලාවක නැගිටපුදෙන්, ඔහුව නින්දෙන් අවදිකරන්න ඔබවහන්සේ යායුතු නැහැ යන්න ඔවුන්ගේ මතය විය. පුද්ගලයන් නින්දෙන් අවදි

කරන්නට යේසුස්වහන්සේ නොයන බවත් රට වඩා බරපතල දෙයක් සිදුවී ඇති බවත් වටහාගැනීමට තරම් ප්‍රඥාවක් ගෝලයන්ට නොතිබුනා සේය. එතරම් අඥාන අය සමග එක්සිත් වෙන්ට අපි නම් කැමති නොවන්නෙමුව.

ලූක් 22:36-38 - **"උන්වහන්සේ ඔවුන්ට කියන සේක් 'දැන් පසුම්බිය ඇත්තෙක් ඒක ගනිත්වා. එසේම මල්ලකුත් ගනීවා, කඩුවක් නැත්තා තමාගේ සළුව විකුණා කඩුවක් මිලයට ගනිත්වා. ඔව්හු ස්වාමීනි බැලුව මැනව කඩු දෙකක් මෙයි තිබේ' යයි කීවෝය".** මෙතනදී සිදුවූ දේ ඇත්තෙන්ම කණගාටුදයකයි. අවුරුදු 3 1/2 ක් ආත්මික දේ ලොව හොඳම ගුරුවරයාගෙන් ඉගෙනගැනීමෙන් පසුවත් ගෝලයන් යේසුස්වහන්සේගේ කථා විලාසය තේරුම් ගෙන තිබුනේ නැත. 'කඩුවක් මිලයට ගනීවා' යන වචනය ඇසූ පමණින් කඩු දෙකක්ම සොයා ගන්නට ගෝලයන් උනන්දුවූ බව පෙනේ. එහෙත් යේසුස්වහන්සේ කථා කලේ කඩු ගැන නොවන බවත් ඉදිරියේදී ඔවුන්ට මුහුණ දීමට තිබුණු ගැටළුකාරී වාතාවරණය පිළිබඳව බවත් ඔවුන්ට තේරුම් ගියේ නැත. ඒ ආත්මික අන්ධභාවය සහ ළද බොළඳ භාවය නිසායි. එහෙත් යේසුස්වහන්සේ ඔවුන්ව සුළු නොකොට ඔවුන් සමග එක්සිත්ව ක්‍රියා කල සේක. "අයියෝ, මේච්චරකල් මම උගන්නපු දේවල් වතුරේ. මේ මෝඩයන්ට නම් කවදාවත්ම උගන්වන්ට බැහැ" යයි උන්වහන්සේ පැවසුවේ නැත.

ලූක් 22:24 - **"ඔවුන්ගෙන් ඉතා උතුම් කොට ගණන්ගනු ලබන්නේ කවරෙක් දැයි ඔවුන් අතරේ විවාදයක් හටගත්තේය"**. මෙවැනි විවාදයක් සිදුවීමට හේතුව පැහැදිලියි. යේසුස්වහන්සේ මරණයට පත්වන බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව තමන් අතරේ ඊළඟ නායකයා සොයාගැනීමට ඔව්හු කලබල වූහ. යේසුස්වහන්සේගේ මරණය පිළිබඳව දුක්වීම වෙනුවට ඊළඟට නායකයා විය හැක්කේ තමා හටදැයි

දැන ගැනීමට ගෝලයෝ උත්සුක වූහ. යේසුස්වහන්සේගේ මරණයට පෙරාතුවම මොවුන් මෙසේ ක්‍රියාකිරීමෙන් උන්වහන්සේගේ සිතට කොතරම් කණගාටුවක් දැනෙන්නට ඇද්ද? එහෙත් එවැනි ගුණමකු ලක්ෂණ පෙන්නුම් කල ගෝලයන් හට යේසුස්වහන්සේ තම මිතුරන් යැයි ආමන්ත්‍රණය කලසේක. ඔහුන්ව හෙළා නොදැක, උපරිම විපාකයක් ඔවුන්ට පොරොන්දු වූ සේක. **"මාගේ පරීක්ෂාවලදී මා සමග සිටි අය නම් නුඹලාය. එබැවින් මාගේ පියාණන්වහන්සේ මට රාජ්‍යයක් නියම කලක්මෙන්ම මාගේ රාජ්‍යයේදී මාගේ මේසයේ කන්වද බොන්වද නුඹලාට රාජ්‍යයක් නියම කරමි" (ලූක් 22:28,29).** යමෙකුගේ දහසකුත් එකක් වැරදි තිබියදී ඒ වැරදි ගැන කථා නොකර ඒ පුද්ගලයා තුල ඇති එක හොඳක් ගැන කථා කිරීමට අපටත් හැකිනම් එය කොතරම් හොඳද? යේසුස්වහන්සේගේ ආදර්ශය එයාකාරයි.

## ක්‍රිස්තුස්වහන්සේ අප පිළිගත් ලෙසම අපත් එකිනෙකා පිළිගැනීම (රෝම 15:7)

යේසුස්වහන්සේ අප පිළිගත්තේ අප පරිශුද්ධව සර්ව සම්පූර්ණව සිටිය විටදී නොවේ. අප පව්කාරයන්ව දෙවියන් වහන්සේගේ සතුරන්ව සිටියදීය. දැන් අපගෙන් බලාපොරොත්තු වන්නේද එලෙස එකිනෙකාව පිළිගැනීමයි. අපගේම සහෝදර සහෝදරියන් වන ඇදහිලිවන්තයන් සතුරන් ලෙස සලකන්නට අප පෙළඹුනේ කෙසේද? මේ අපගේ ආත්මික පරිහානියේ ලක්ෂණයකි. තමා පවාදෙන්නට සිටි යුදස් ඉස්කාරියොත්ට එරෙහිවවත් යේසුස්වහන්සේ සෙසු ගෝලයන් හා එකතුවී කුමන්ත්‍රණය කලේ නැත. එහෙත් ඒ ආදර්ශය නොසලකා අපි අපට සුළු හෝ වැරැද්දක් කරන අයට එරෙහිව අනිකුත් ඇදහිලිවන්තයන් සමග කුමන්ත්‍රණය කරන්නෙමු. ක්‍රිස්තුස්වහන්සේ අප පිළිගත් ලෙසම අපත් එකිනෙකා පිළිගත යුත්තේමය. එසේ නොකලොත් විනිශ්චය වන්නේ අපවමයි.

ක්‍රිස්තුස්වහන්සේ තුල අපගේ ඇදහිලිවන්ත කමේ ඔප්පු සාක්ෂිය නම් අප තුල හමුවන ක්‍රිස්තු චරිතයයි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ චරිතයේ දීප්තිය සහ අලංකාරය පිළිබඳව ඉතා සැකවින් අප සලකා බැලූ අදහස් දැන් කල්පනා කර බලා ඒ වෙතට අපගේ පාද හරවා ගනිමු. නිවැරදි මාර්ගය ක්‍රිස්තුස්වහන්සේගේ මාර්ගයයි. උන්වහන්සේගේ චරිතයේ දීප්තිය සහ අලංකාරය අපගේ ජීවිතය තුළට ඇතුලත්කර ගැනීමට අප මෙතරම් පසුබට වී ඇත්තේ ඇයි? මේ තත්වය වෙනස් විය යුතුමයි.

යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ මහිමය ගැන අවබෝධයක් ඇති අපි ඒ මහිමයෙන් කියැවෙන ආත්මික පණිවිඩය ඔස්සේ ගමන් කිරීමට සිත හදගත යුතු වෙමු.